# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු
# විජ්ජා උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

# පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු විජ්ජා උදපාදි

පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ විසින්

2017 සැප්තැම්බර් 12 වැනි දින

සරණ පාර, කොළඹ 7 හි දී පවත්වන ලද ධර්ම දේශනය.


පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

පළමුවන මුද්‍රණය - 2017 ඔක්තෝම්බර්
(පිටපත් 6,000)

**ධර්ම දානය පිණිසයි.**

**සංස්කරණය:**
එච්. ඒ අමරතුංග
දිල්රුක්ෂි වීරරත්න
ලක්මි කුරුප්පු

**පිටපත් ලබා ගැනීමට:**
හෝමාගම - 011 2752352
මහනුවර - කේ. දයානන්ද මහතා - 077 7665198
මාතලේ බෝගහකොටුව විහාරය - 071 4466838
මාතර - කේ. ජී. මුණිදස මහතා - 071 4438747 - 077 3295174

**ප්‍රකාශනය:**
තිලාන් පතිරණ, මාතර
(පිටපතක මුද්‍රිත වැය රු. 20/=)

**මුද්‍රණය:**
කොලිටි ප්‍රින්ටර්ස්
17/2 පැඟිරිවත්ත පාර, නුගේගොඩ
දු.ක: 011 4 870 333

# 2017-09-12 දින සරණ පාර, කොළඹ 7 හි දී පවත්වන ලද ධර්ම දේශනය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

***ජාතිඤ්ච පජානාති, ජාතිසමුදයඤ්ච පජානාති, ජාතිනිරොධඤ්ච පජානාති, ජාතිනිරොධගාමිනි පටිපදඤ්ච පජානාති - එත්තාවතාපි ඛො, ආවුසො, අරියසාවකො සම්මාදිට්ඨි හොති, උජුගතාස්ස දිට්ඨි, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො, ආගතො ඉමං සද්ධම්මං'ති.***[1]

ධර්මශ්‍රවණාභිලාෂී ශ්‍රද්ධා බුද්ධි සම්පන්න, කාරුණික පින්වතුනි, මේ පින්වත් සියලු දෙනා ම දැන් මේ සූදානම් වෙන්නේ, සසර දුක්ගිනි නිවීම පිණිස ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් දේශනා කළ සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවණය කරන්න යි.

ඒ නිසා මුලින් ම හැමදෙනාට ම එක කරුණක් මතක් කරනවා. ස්වභාවයෙන් ම බුදුදහම ගැඹුරු යි, ගැඹුරු අරුත් ඇති දර්ශනයක්. ඒ දර්ශනය, මේ ධර්මය සෙලවෙන මනසක් ඇති, විසිරුනු මනසක් ඇති කෙනෙකුට ග්‍රහණය කරගන්න අපහසු යි. ඒ නිසා හැමදෙනා ම දේශනාව ආරම්භයේ පටන්, අවසන් මොහොත දක්වා ම හිතේ හිතේ එක එක දේවල් හිතන්නේ නැතුව, විතර්ක උපද්දවන්නේ නැතුව මේ දේශනාව ඔස්සේ ම හිත මෙහෙයවමින් හොඳට ශ්‍රවණය කරන්න කියලා මතක් කරනවා. මේ දේශනාව ශ්‍රවණය කරන අතරේ දී, දේශනාව ඇසුරෙන් හෝ හිතට ප්‍රශ්නයක් ඇති වුණොත්, ඒක ද විතර්කනය කර කර ඉන්නේ නැතුව දේශනාව එක දිගටම අහන්න. ඒ ප්‍රශ්න වලට උත්තර දේශනාව අවසානයේ දී හම්බවෙයි. ඒ නිසා චිත්ත ඒකග්ගතාවය නැත්නම් සිත එක්තැන් කරගන්න කාරණාව මේ ධර්ම ශ්‍රවණයේ ප්‍රථම අංගය යි.

---

[1] සම්මා දිට්ඨි සූත්‍රය, මූලපරියාය වග්ගො, මූලපණ්ණාසකපාළි, මජ්ඣිම නිකාය

ධර්මයේ පෙන්නනවා, ධර්මය අවබෝධ කරගන්න පුළුවන්, පාරමිතා සම්පූර්ණ වෙලා තියනවා කියන ජීවිතයක ලක්ෂණය මොකක් ද? තථාගතයන්වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙක් හෝ ධර්ම දේශනා කරනු ලබන කල්හි මුළු හිතින් ම, සම්පූර්ණ කන මෙහෙයවලා, ඒ දේශනාව හොඳින් ශ්‍රවණය කරන බව. ඒ **දේශනාව හොඳින් ශ්‍රවණය කළහම, එයාට ඒ දේශනාව අවසානයේ දී ඒකාන්තයෙන් ම නුවණක් පහළ වෙනවා, දුක කියන්නේ මේක නේ ද? දුක ඇතිවෙලා තියෙන්නේ මෙහෙම නේ ද? මෙන්න මේ වැරැද්ද නො කළොත් දුක නැතිවෙනවා නේ ද? ඒ සඳහා මෙන්න මේ ටික කළ යුතු යි කියන ටික දකින්න පුළුවන්. ඒ ටික දකින එකට තමයි 'සම්මා දිට්ඨි' කියලා කියන්නේ. 'දිට්ඨි සම්පන්න යි' කියලා කියන්නේ. සද්ධර්මයට ආවා කියලා කියන්නේ.**

ඉතින් ඇයි අපි ඒ තරම් උවමනාවෙන්, ඒ තරම් ඕනෑකමින් ශ්‍රවණය කළ යුත්තේ? පින්වතුනි, වෙන මොකුත් නිසා නෙවෙයි. දුක් සහගත බව නිසා යි. මේ ජීවිතයේත්, අනන්ත ජාති සංසාරයේත්, පින්වතුනුත්, මමත් හැමදෙනා ම බොහෝ දුක් වින්ද අය යි. නමුත් භවයෙන් වැහිලා නිසා අපට පෙනෙන්නේ නෑ. භවය කියන තැන හිරගෙයක් වගෙ යි. ගිනිගත්ත යකඩ වැටක් වගේ දකින නිසා යි බුදුරජාණන්වහන්සේලා ලෝකයේ පහළ වෙන්නේ. ලෝකය තුළ, දුක නැති කරලා ඉන්න පුළුවන් එකදු තැනක් වත් තියෙයි නම්, සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පහළ වීම අවශ්‍ය නෑ. නමුත් ලෝකය කියන එක දුකින් ම පිරුණු, දුකින් ම මැඩුනු තැනක් නිසා යි එබඳු වූ දුක් සහගත ලෝකයෙන් මිදෙන මාවත පෙන්නන්න ලොව්තුරා බුදුරජාණන්වහන්සේලා පහළ වෙන්නේ. ඉතින් බුදුරජාණන්වහන්සේලා ලෝකයේ පහළ වුණත්, වස්තුකාම, ක්ලේශ කාමයෙන් පීඩිත වෙච්ච, තණ්හාවෙන් ලෝකය ඇත්ත ම වෙච්ච, මේ ලෝකයාට ඒ ධර්මය හොයන්න බලන්නවත් විවේකයක් නෑ. හම්බවෙන්නේ නෑ. පාරමිතා පුරන්න ඕනේ කියලා ධර්මයේ තියෙන්නෙත් සසර ටිකෙන් ටික, ටිකෙන් ටික හරි නිස්සරණ ස්වභාවය හුරු පුරුදු කරපු මනසකට යි ධර්මය හොයන්න ඕනේ, ධර්මය අහන්න ඕනේ, සසරින් එතෙර වෙන්න

ඕනේ කියන අදහසක්වත් ඇතිවෙන්නේ. ඉතින් මේ පින්වතුන් සතුටුවෙන්න ඕනේ අද මෙතැනට මෙහෙම ආවෙත් සසර පූර්ව හේතු පින්වතුන් හැමදෙනාට ම තියන නිසා, ධර්මයකින් සැනසිල්ල ලබාගන්න ඕනේ කියන හැඟීම සසරේ දීත් පුරුදු පුහුණු කළ ගතිය තියන නිසා යි. මේ ජීවිතයේ මොන තරාතිරමක් අප තුළ පැවතුනත්, ඒ ඔක්කොම තබලා මේ ධර්මය වටා එකතු වුණේ, එකතු වෙන්නේ ඒ නිසා යි. පින්වතුන්ට එක දෙයක් විතරයි සකස් කරගන්න තියෙන්නේ. ඒ තමයි ඉතාමත් හොඳට හිත සකස් කරගෙන, හිත එක්තැන් කරගෙන මේ දේශනාව ශ්‍රවණය කරන්න.

විශේෂයෙන් ම මම පෙන්නන්න හදන කරුණු ටිකක් ගැඹුරු වැඩි යි. මම හිතලා ගැඹුරු යමක් කියනවා, ගැඹුරු කරනවා නෙවෙයි. අපි නො ගැඹුරු යි. ලෝකයේ බුදුරජාණන්වහන්සේලා පහළ වුණත්, නැතත් ලෝකයක් හැදෙන්නේ කොහොම ද? දුක හැදෙන්නේ කොහොම ද කියන ක්‍රමයක් තියෙනවා. මොනවා හරි දෙයක් ඇති වුණහම ඇතිවෙච්ච ක්‍රමයක් තියනවා නේ? ඒ වගේ, අප දුක් විඳිනවා නම්, අපට දුක එනවා නම්, ඒ දුක ඇතිවෙච්ච සැබෑ ක්‍රමයක් තියනවා. බුදුරජාණන්වහන්සේ කළේ ඒ සැබෑ ක්‍රමය හොයාගත්ත එක යි. හොයාගෙන ලෝකයට දේශනා කළා. ඒ ක්‍රමය නැති කළා ම දුක නැතිවෙනවා කියන ධර්මතාවයකුත් තියෙ යි. ඒ දුක ඇති නො වෙන ක්‍රමයත් හොයාගත්තා. හොයාගෙන ලෝකයට දේශනා කළා. ඉතින් ඒක තේරුම්ගන්න පුළුවන් හැම කෙනෙක් ම ඒ මාවතේ ගිහිල්ලා දුක නැති කරගත්තා.

අද මම ජීවිත අවබෝධය ලබා දෙන්න පුළුවන්, බොහෝ ම වටිනා දහම් පරියායක් තමයි පෙන්නන්න හදන්නේ. ඒ නිසා මේ ටික ඉතාමත් ම ආදරයෙන්, මේ ස්වාමීන් වහන්සේ පෙන්නන්න හදන්නේ මොකක් ද කියලා, කෙසේ ද, කෙසේ ද යන අදහස ඇතුව හොඳ උවමනාවෙන් අහන්න.

පින්වතුනි, සැරියුත් මහාරහතන්වහන්සේ දේශනා කරනවා, **යම් කිසි කෙනෙක් ජාතිය කියන්නේ මොකක් ද කියන එක දන්නවා නම්, ජාතිය කියන එක ඇතිවෙන හැටි දන්නවා නම්, ජාතිය කියන**

**එක නැතිවෙන හැටි දන්නවා නම්, ඒ ජාතිය නැති කරන ප්‍රතිපදාව මෙන්න මේක යි කියලා දන්නවා නම්, අන්න එයා නිවැරදි දෘෂ්ටිය ඇති කෙනෙක්. එපමණකින් ම එයා සම්මා දිට්ඨියෙන් යුක්ත පුද්ගලයෙක්.** *එත්තාවතාපි ඛො, ආවුසො, අරියසාවකො සම්මාදිට්ඨි හොති.* එයාගේ දෘෂ්ටිය ද සෘජු බවට ගියා වූ, *උජුගතාස්ස දිට්ඨි,* එයා ධර්මයේ ගුණ දන පැහැදීමෙන් යුක්ත කෙනෙක් වුණා වෙනවා. එයා පෘථග්ජන භූමිය ඉක්මවා, මේ සද්ධර්මයට ආව කෙනෙක් වෙනවා කියලා පෙන්නුවා.

මොකක් ද ජාතිය කියලා කියන්නේ? එතන දී මම මුලින් ධර්මතා ටිකක් පෙන්නන්නම්, බුදුරජාණන්වහන්සේ ජාතිය කියලා අර්ථ දක්වන තැනත් පෙන්වන්නම්. පින්වතුන් අහලා ඇති බුදුරජාණන්වහන්සේට මේ ධර්මය අවබෝධ වුණ වෙලාවේ දී ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදි [2] පෙන්නනවා, *පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.* පෙර කවදාවත් ම අහලා නැති, නො ඇසූ-විරූ, ලෝකයාගෙන් වත් කිසි ම කෙනෙකුගෙන් අහලා නැති ධර්මයක් කෙරෙහි තථාගතයන්වහන්සේට, *චක්ඛුං උදපාදි,* දහම් ඇසක් පහළ වුණා, *ඤාණං උදපාදි,* ඤාණය පහළ වුණා, විද්‍යාව පහළ වුණා, ආලෝකය පහළ වුණා කියලා පෙන්නනවා. ඒ කියන්නේ මේ ලෝකයේ කිසි කෙනෙකුට හම්බවෙන්නේ නැති, දකින්න බැරි, දැක්කේ නැති, දර්ශනයක්. ඒකෙ දී අපි මෙච්චර කාලයක් ම ජාතිය කියන එක - ජාතිය කියන්නේ සිංහලෙන් ඉපදීම කියන එක යි, හටගැනීම කියන එක යි. ලෝකයේ අපි හැම කෙනෙක් ම ජාතිය කියන එක, ඉපදීම කියන එක දකින්නේ මව්කුසකින් බිහිවීම ලෙසයි. ඒ ඉපදීම ජාතිය නම් මේ සාසනයෙන් බැහැර අයත් මේ ජාතිය ගැන දන්නවා. ඉපදීම ගැන දන්නවා වෙනවා. නමුත් තථාගතයන්වහන්සේ ඊට වඩා ගැඹුරු අර්ථයකින් මේක දේශනා කරන්නේ. සත්‍යය වූ අර්ථයකින් දේශනා කරන්නේ.

---

[2] ධම්මචක්කප්පවත්තන වග්ගො, සච්ච සංයුත්තං, මහාවග්ගපාළි, සංයුත්ත නිකාය

පින්වතුනි, ජාතිය කියන කොට, මේ **ජාතිය ක්‍රම දෙකක් තියනවා**, හොඳට මතක තබාගන්න ඕනේ. **ඉපදීම දෙ ආකාරයි.**

1. *තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති- 'ජාති'* [3] කියලාත් තථාගතයන්වහන්සේ ජාතිය විස්තර කරනවා. **ඒ ඒ සත්ත්වයන්ගේ, ඒ ඒ සත්ත්ව නිකායන්ගේ ඉපදීමක් තියෙනවා නම්, හටගැනීමක් තියෙනවා නම්, ස්කන්ධයන්ගේ නැවත ලැබීමක් තියෙනවා නම්, හොඳට බලන්න ආයතනයන්ගේ නැවත ලැබීමක් තියෙනවා නම් මෙන්න මේක ජාතිය යි. චතුරාර්ය සත්‍යයේ දී ඔය ටික යි තථාගතයන් වහන්සේ පෙන්නන්නේ.**
2. තවත් ජාතියක් තියෙනවා, *තෙසං තෙසං ධම්මානං ජාති සඤ්ජාති*[4], ඒ ඒ ධර්මයන්ගේ ඉපදීම. ඒ ඒ ධර්මයන්ගේ හටගැනීමකුත් තියෙනවා.

නමුත් මෙතන දී තථාගතයන්වහන්සේ ධර්ම දේශනා කරන්නේ අනුපාදා පරිනිර්වාණයට විතර යි. ඒ කියන්නේ අරිහත්වයට විතර යි. පුද්ගලභාවයෙන් එන දුකට විතර යි. එතන සත්ත්ව, පුද්ගලභාවයේ ඉපදීමත්, සත්ත්ව, පුද්ගල නො වන ධර්මතාවයන්ගේ ඉපදීමත් කියලා ධර්මතා දෙකක් තියනවා. ඒක යි මම කිව්වේ ජාතිය දෙ ආකාරයකින් තියනවා කියලා.

අපි මතක් කළොත් ලෝකයේ හැම කෙනෙක් ම දකින්නේ මව්කුසකින් බිහිවීම ජාතිය කියලා යි. පුද්ගලයෙක්ගේ ජාතිය කියලා යි. කෙනෙක්ගේ ඉපදීම කියලා යි. නමුත් මේක එසේ නො දත යුතු යි. එතන තියෙන්නේ ධර්මතාවයක හටගැනීමක්. අපි ක්‍රමානුකූලව බලමු.

---

[3] සච්ච විභංග සූත්‍රය, විභංග වග්ගො, උපරිපණ්ණාසකපාළි, මජ්ඣිම නිකාය
[4] පටිච්චසමුප්පාදවිභඞ්ගො, විභඞ්ගපාළි, අභිධර්ම පිටකය

**පෙර අවිද්‍යාවෙන් කර්ම රැස්කර ගත්තහම, ඒ කර්ම නිමිත්තක් නිසා විඤ්ඤාණය නැත්නම් සිත රූපයකට බැස ගත්තහම ඇස, කන, දිව, නාසය කියන මේ ආයතන ටික හදනවා. තවම කෙනෙක්ගේ නෙවෙයි. ධර්මතාවයක්. ඒ ආයතනයන්ට බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස කියන අරමුණු ගැටෙනවා. ඒ ස්පර්ශය නිසා රූපයක් විඳින්න පුළුවන්, ශබ්දයක් විඳින්න පුළුවන්, ගන්ධයක් විඳින්න පුළුවන්, සැප හෝ දුක හෝ උපේක්ෂා මට්ටමින් විඳින්න පුළුවන් වේදනාවකුත් පහළ වෙනවා. ඒ ද තවම කෙනෙක්ගේ නෙවෙයි. ධර්මතාවයක්. ඔන්න ඔය ධර්මතාවයක් වූ ආයතන ටික පුරාණ කර්ම ප්‍රත්‍යයෙන් හටගත්ත *තෙසං තෙසං ධම්මානං ජාති,* කියන තැන, ඒ ඒ ධර්මයන්ගේ හටගැනීමක්. ස්කන්ධ ටිකක්. කෙනෙක්ගේ නෙවෙයි. සත්ත්‍වයෙක් නෙවෙයි, පුද්ගලයෙක් නෙවෙයි. මම නෙවෙයි. ආත්මයක් නෙවෙයි. හේතු ප්‍රත්‍ය යි. ආහාර ප්‍රත්‍යයෙන් තියෙන්නේ.**

ඔන්න එබඳු වූ රූපයක් පින්වතුන්ට ඇස් ඉදිරිපිටට පෙනෙනවා කියන්න කෝ. ඔන්න දැන් ඇස් ඉදිරිපිටට රූපයක් පෙනෙන කොට, මේ පෙනෙන සිද්ධිය ධර්මතාවයක්. සත්ත්වයෙක්, පුද්ගලයෙක් නෑ. යම් වෙලාවක දී ඇස් ඉදිරිපිටට එන රූපය අරබයා, අපි රස විඳ ගැනීම් අනුව බලනවා නම්,

- **ඇස් ඉදිරිපිටට එන රූපයේ යථාභූත ස්වභාවය, ඒ කියන්නේ යමක් පෙනෙනවා කියලා, පෙනෙන දේ දූනගන්නවා කියලා, වුණේ මෙන්න මේක නේ ද කියලා පින්වතුන් දන්නේ නැත්නම් එතන අවිද්‍යාව තියනවා.** අවිද්‍යාව හෝ තණ්හාව හෝ මේ පෙනෙන රූපායතනයට පතිත වුණොත්, තියන දෝෂය මොකක් ද? ඇසට පෙනෙන රූපයේ ඇත්ත ඇති හැටිය නො දකින කොට - ඒක දැන් වර්තමාන දෝෂයක්. තවමත් කෙනෙක්ගේ නෙවෙයි. ඒක අවිද්‍යාවේ කෘත්‍යයක්.
- ඒ නිසා පෙනෙන දේ අරබයා රස විඳගැනීම් අනුව බලනවා. ඒක තණ්හාව. ඇසට පෙනෙන රූපය පැත්තට නැඹුරු වෙලා, **ඇසට පෙනෙන රූපයේ ඇත්ත නො දන්නාකම**

**(අවිද්‍යාව) ඒ පැත්තට නැඹුරු වෙලා, *සංකප්පො කාමො රාගො කාමො සංකප්ප රාගො කාමො*[5] කැමැත්ත ඇතිකර ගන්නවා නම්, කැමැත්ත ඇතිවෙන විදිහට හිතනවා නම් මෙන්න මේකට කියනවා තණ්හාව කියලා.** පෙනෙන අරමුණේ රසයක් තමන්ට දැනෙනවා නම්, ප්‍රිය මනාප ගතියක් තමන්ට දැනෙනවා නම් ඒකේ සතුටුවන කමට කියනවා තණ්හාව කියලා.

- තණ්හාව නිසා උපාදන වෙනවා. **උපාදන කියන්නේ ඒ වස්තුව මම, මගේ කියලා පෙනෙන අරමුණ ගන්න බවකුත් තියනවා.**
- **පෙනෙන අරමුණට තණ්හා, උපාදන වුණොත් දෝෂයක් තියනවා. මොකක් ද දෝෂය? වස්තුව ඇස් ඉදිරිපිටින් ගියත්, ඇස නිරුද්ධ වුණත්, සිත නිරුද්ධ වුණත්, දැකපු අරමුණ, එලෙස ම තමන්ගේ මනසේ ඇති බවට හැපිලා හිටිනවා. ඔන්න ඕකට තමයි භවය කියන්නේ, කර්ම භවය කියන්නේ.**

රූපයක් පෙනෙන තැන දක්වා ම තිබුනේ ඵස්ස පච්චයා වේදනා කියන තැන යි. ඒකට තණ්හා, උපාදන වශයෙන් දරුවෙක්, දරුවා හොඳයි, රත්තරං, රත්තරං හොඳයි, ගෙයක්, ගේ හොඳයි. මේ විදියට අපි පෙනෙන අරමුණ අරබයා හිත හැසිර වුවහොත්, හිත මෙහෙය වුවහොත් තියන දෝෂය මොකක් ද? ඒ තණ්හා, උපාදන දෙකේ දෝෂය මොකක් ද? භවය ඇති කරනවා. භවය කියලා කියන්නේ ඇස යි, රූපය යි දෙක වෙන් වුණත්, ඒ නිසා එන හිත නිරුද්ධ වුණත්, දැකපු අරමුණ ඇතිකමට අපේ හිතේ නිමිත්තක් හිටිනවා. ඒකට කියනවා භවය කියලා.

භවය තිබුනොත් තියන දෝෂයක් තියනවා, මොකක් ද? ජාති. තමන්ව නිර්මාණය වෙනවා. පුද්ගලයා උපදිනවා. මේ කෙනාව. පින්වතුන්ට කවුරු හරි බැන්ණොත් තරහා යනවා, දුක හිතෙනවා නේ ද? මොකද ඒ? බැනුම් අහන කෙනා ඉන්න නිසා. හිතට වෙහෙස, වේදනාව දැනෙන කෙනා ඉන්නවා. ඔය කෙනා

[5] කාමසුත්තනිද්දෙසො, මහානිද්දෙසපාළි, ඛුද්දක නිකාය

නිර්මාණය වෙන්නෙ මෙන්න මේ භවය නිසා යි. ඒකයි *තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති,* පින්වතුන්ට දකින හැම දෙයක් ම ඉතුරු වුණොත්, අහන හැම දෙයක් ම ඉතුරු වුණොත්, දැක්කයින් පස්සෙත් දැකපු දේ නිරුද්ධ නොවී ඇති බවට මනසේ හැපි හැපි හිටියොත්, ඇහුවොත් අහන දේ ඇසීමෙන් පස්සේ ඉවර වෙන්නේ නැතුව අහපු දේ ඇති බවට මනසේ සිහි කරන්න පුළුවන් බව හිටියොත්, මේ වගේ ස්පර්ශ ආයතන හයේ ම දකින, අහන, ගඳ/සුවඳ ලබන, රස විඳින, ස්පර්ශ කරන සියලුම දේ පින්වතුන්ට ඇති බවට හම්බවෙන කොට, ඔය ඇති බව එල්ලගෙන ඉන්නේ පුද්ගලයා යි. පුද්ගලයා නිර්මාණය වෙන්නේ මේ කාරණා ටිකෙන්. කෙනාව නැතිවෙන්නේ නෑ. තමන් කියන, නැත්නම් මේ පුද්ගලයාව උපදිනවා.

මෙන්න මේ පුද්ගලයා හිටියොත් තියන දෝෂයක් තියනවා, නින්ද, අපහාස, ඇණුම් බැණුම්, තාඩන, පීඩන, හිත් අමනාපකම්, වේදනා මේ ඔක්කෝම දුක් ටිකත් පුද්ගලයාට විඳින්න වෙනවා. ඒ විතරක් නෙවෙයි, ලෙඩ වීම, මහළු වීම, මරණය කියන මේ දුක් ඔක්කෝ ම විඳින්න වෙනවා. පුද්ගලයෙකුට යි විඳින්න වෙන්නේ. මරණ දුක විඳින්න වෙන්නේ ජීවත්ව ඉන්න කෙනෙකුට මිසක මැරෙන වෙලාවෙ දී එයා දන්නේ නෑ. ජීවත්ව ඉන්න කෙනෙකු යි මරණ දුක විඳින්නේ. මැරෙන්න ඉස්සරවෙලා මේ පංචායතනය ම සම්පූර්ණ අක්‍රිය වෙනවා. හීනයක් බල බලා නිදාගෙන ඉන්න කොට බෙල්ල කැපුවොත්, දන්නවා ද පින්වතුන්, මේ මාව මරනවා කියලා? නෑ. ඒ වගේ මරණ දුක විඳින්න වෙන්නේ ජීවත්ව ඉන්න කෙනෙකුට යි. ලෙඩ වෙච්ච දුක විඳින්න වෙන්නේ ජීවත්ව ඉන්න කෙනෙකුට යි, මහළු වෙච්ච දුක විඳින්න වෙන්නේ ජීවත්ව ඉන්න කෙනෙකුට යි.

මෙන්න මේ සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීමට යි බුදුරජාණන් වහන්සේ ජාති කියලා කිව්වේ. කෙනාගේ ඉපදීමට යි ජාතිය කියලා කිව්වේ. පුද්ගලයාගේ ඉපදීමට යි ජාතිය කියලා කිව්වේ. ඔය පුද්ගලයා, ඔය පුද්ගල ස්වභවය, දුක් විඳින්න පුළුවන් කෙනා කවදාවත් ම නැතිවෙන්නේ නෑ, භවය නැති නො වුණොත්. ඒකයි

***ජාතිඤ්ච පජානාති*** **කියන කොට එයා ජාතිය දන්නවා. මොකක් ද? මේ තමන්ගේ ඉපදීම යි, පුද්ගලභාවයේ ඉපදීම යි, සත්ත්ව පුද්ගල හැඟීමේ ඉපදීම යි. තම තමන්ට පුළුවන් නේ ද මේ මම කියලා හිතන්න. මම කියලා සිහිකරන්න පුළුවන් නේ ද? අන්න ඒ මම කියලා සිහිකරන්න පුළුවන්කමට කියනවා ජාතිය කියලා. හැබැයි නිකම් ම වචනයක් නෙවෙයි, තමන්ට ඇස් තියන, කන් තියන, නාසය තියන, ශරීරය තියන, අතපය තියන මේ පුද්ගලයා ම. කනක් කැපුවොත් මේ මගේ කන කැපුවා කියලා තමන්ට දුක් විඳින්න පුළුවන් නේ? අතක්, පයක් කැපුවොත් මේ මගේ අත කැපුවා, කකුල කැපුවා කියලා තමන්ට දුක් විඳින්න පුළුවන් නේ? ඒ පුද්ගලයා ගැන යි මේ කියන්නේ. මේ පුද්ගලභාවයේ ඉපදීම. මේ ශරීරයක් මගේ වෙලා. සතරමහාධාතුවෙන් හැදුනු, කන බොන ආහාරයෙන් හැදුනු, කුණප කොටස් තිස්දෙකකින් යුක්ත මේ රූප මිටිය මම වෙච්ච කමටයි 'ජාති' කියලා කිව්වේ. එයා මනුස්සයෙක් වෙලා ඉපදිලා මනුස්සයන් අතර.**

මනුස්සයා කියන්නේ පඨවි ධාතුවට ද? නෑ. හොඳයි, මේ ශරීරයේ තියන කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් මේ කොටස් ටික අයිති මොකකට ද? ධාතු වලින් අයිති මොකකට ද? පඨවි ධාතුවට යි. එහෙනම් ඔය කොටස් ටික ද මනුස්සයා? නෑ. එහෙනම් මනුස්සයා කියලා කියන්නේ ආපෝ ධාතුවට ද? නෑ. මේ ශරීරයේ තියන පිත්, සෙම්, සැරව, ලේ, දහඩිය කියන මේවා මොකකට ද අයිති? ආපෝ ස්වභාවයට යි. එහෙනම් මනුස්සයා කියලා කියන්නේ තේජෝ ධාතුවට ද? නෑ. මේ ශරීරයේ තියන දවන, තවන, දිරවන, පැසවන ස්වභාවය අයිති මොකකට ද? තේජෝ ධාතුවට යි. එහෙනම් මනුස්සයා කියන්නේ වායෝ ධාතුවට ද? නෑ. මේ ශරීරයේ තියන හමන, පිම්බෙන, හැකිලෙන, සොලවන ස්වභාවය අයිති මොකකට ද? වායෝ ධාතුවට යි. **මේ ශරීරය බෙදුවොත් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතරමහාධාතුවෙන් යුක්ත යි. ඒ සතරමහාධාතු රූපය මගේ වෙච්ච තැන, මම වෙච්ච තැන තමයි පුද්ගලයාගේ ඉපදීම. මේ ආයතන ටික උරුමවෙච්ච දවස එදා යි.**

මේක උරුම වුණේ මේ සතරමහාධාතු රූප මිටිය, මම වගේ පෙනෙන්නේ කුමක් නිසා ද?

**භවය නිසා යි. භවය කියලා කිව්වේ, '*චෙතනා භවො*' දැකපු, අහපු, ගඳ/සුවඳ ලබපු, රස විඳපු, ස්පර්ශ කරපු අරමුණු, හටගෙන නිරුද්ධ වෙනවා අපි දැනගත්තත්, නො දැනගත්තත්. නමුත් ඒවා රස විඳ ගැනීම් අනුව බැලුවොත්, බලන කොට මොකද වෙන්නේ? ඇති බවට මනසේ නැවත නැවත හැපි හැපි හිටිනවා. ඇති බවට හිටින කොට මේ ශරීරයත් ඇති බවට තමන්ට උරුම වෙලා තියෙන්නේ ඔන්න ඔය භවය හරහා යි.** මම සරළ උපමා කියලා දෙන්නම්.

පින්වතුන්, පින්වතුන්ගේ ඇස් දෙක දැකලා තියෙයි ද? නෑ. කණ්නාඩියෙන් බැලුවහම මේ ඇස කියලා නිමිත්තක් ගත්තහම, කණ්නාඩියට වැටුන රූපය නිරුද්ධ වෙයි. නමුත් ඒ නිමිත්තට මේ ඇස මෙහෙම යි කියලා මනසේ හැපි හැපි තියන කොට ඔන්න දැන් මට ඇස තියනවා වගේ. පින්වතුන්, පින්වතුන්ගේ මූණ දැකලා තියෙයි ද? නාසය, කන, පිට, ඔළුව අරමුණෙන් අරමුණ කොටස, කොටස එකතු වෙලා තමයි මේ පුද්ගලයා අපට හැදිලා තියෙන්නේ. බුදුරජාණන්වහන්සේ ඕකට කියනවා, මේ ස්පර්ශ ආයතන හයේ රස විඳ ගැනීම් අනුව බලන කොට *පඤ්චුපාදනක්ඛන්ධා උපචයං ගච්ඡන්ති*[6]. පංචඋපාදනස්කන්ධය උපචයට යනවා, රැස්වෙනවා. අන්න ඒ රැස්වීම යි මේ පුද්ගලයාගේ නිර්මාණයට හේතුව. මේ රූප මිටිය මම කියලා, තමන් කියලා, පුද්ගලයෙක් හැටියට දකිනවා නම්, අන්න කෙනාගේ ඉපදීම. දැන් අප දැක්කා රූප මිටිය පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඒ එකක්වත් මනුස්සයෙක් නෙවෙයි නේ. නේ ද? එතකොට ඒ **සතරමහාධාතු රූපය යම් වෙලාවක පින්වතුන්ට මම කියලා තේරුනා නම්, පෙනුනා නම්, මගේ කියලා දැනෙයි නම්, අන්න එදා පින්වතුන් මනුස්සයෙක් වෙලා උපන්න අය. ඉපදිච්ච අය.** මේ රූප මිටිය

---

6 *තස්ස සාරත්තස්ස සංයුත්තස්ස සම්මූළ්හස්ස අස්සාදානුපස්සිනො විහරතො ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති* - මහාසළායතනික සූත්‍රය, සළායතනවග්ගො, උපරිපණ්ණාසකපාළි, මජ්ඣිම නිකාය

අපට ඇත්ත ම වෙලා, මේ මම ම වෙලා හිටියට හොඳට තේරුම් ගන්න අත පය, ඇස්, කන්, දිව, නාසය, ශරීරය ඇති මේ මගේ ඉපදීමට හේතුව භවය යි.

මොකක් ද භවය කියන්නේ? දකින දේ ඇති බවට පෙනෙනවා, අහන දේ ඇති බවට පෙනෙනවා. උපමාවක් කිව්වොත්, දැන් පින්වතුන්ට පුළුවන් ද අපේ මේ රූපසිංහ මහත්තයා ඉන්න කාමරය ඇතුලේ තියන බඩුමුට්ටු සිහිකරන්න? එතුමා නිදාගන්න තැන? නැත්නම් කුස්සියේ තියන බඩුමුට්ටු සිහි කළ හැකි ද පින්වතුන්ට? බෑ. ඇයි බැරි? දන්නේ නෑ. හොඳයි දැන් බැරිවෙලා පින්වතුන් ගිහිල්ලා බැලුවොත්, බලනවා කියන්නේ ඇසින් රූප නිමිත්තක් ගන්න එක නේ. ගිහිල්ලා බලලා මෙතන ඉඳ ගත්තොත් සිහි කරන්න බැරි ද? පුළුවන්. ඉස්සෙල්ලා සිහි කරන්න බෑ, ඇහෙන් බලලා ආවහම සිහි කරන්න පුළුවන් නම් පින්වතුන්ට තේරෙනව ද බලපු දේ එකතු වෙනවා කියලා? එතන තියන දේ නම් පෙනෙන්නේ බලන්න ඉස්සල්ලාත් පෙනෙන්න ඕනේ නේ. නේ ද?

දැන් එහෙනම් ඒ කාමරයට ගිහිල්ලා ඇහෙන් බලන අවස්ථාවට තමයි බුදුරජාණන්වහන්සේ *චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො* කියලා කිව්වේ ඇහෙන් රූපය පෙනෙන අවස්ථාව යි. ඔන්න පෙනෙන අරමුණේ ඇත්ත නො දන්නාකම නිසා හෝ පෙනෙන අරමුණ කෙරෙහි ප්‍රමාදීව වාසය කරන කම නිසා හෝ මොකද වෙන්නේ? ඒක බලලා මෙතෙන්ට ආවහම දැන් පින්වතුන්ට සිහි කළ හැකි යි. **දැන් මේ රූපායතනයට කියනවා උපචය රූපය කියලා.** ඉස්සල්ලා ම ඇහැට හම්බ වුණු රූපය චක්ඛු සම්ඵස්සය නිසා හටගත්ත වර්ණ සටහන යි. ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත එක. භූත වූ රූපය. සැබෑ ම රූපය. ඒ රූපයේ රස විඳ ගැනීම් අනුව බලන කොට, නැත්නම් එහෙම රස විඳ ගැනීම අනුව බලන්න ඕනෙත් නෑ, **සංයුත්ත නිකායේ චෙතනා සූත්‍රයේ තියෙන්නේ, අනුසය - පෙනෙනවා කියන දෙයක් වෙන්නේ කොහොම ද කියන එක දන්නේ නැතිකම ම ප්‍රමාණවත්. මෙතෙන්ට ආවොත් පෙනෙන රූපය ඒ විදිහට ම මනසේ හැපිලා**

**හිටිනවා. ඕකට කියනවා උපචය රූපය. ඒ කියන්නේ රූපය රැස්වෙලා. අන්න ඒ උපචය රූපයට යි නැත්නම් රූපය රැස්වෙච්ච කමට යි භවය කියලා කිව්වේ.** ඔන්න ඔය විදිහට දකින දකින හැමදෙය ම උපචය වුණොත්, අඩු නැතුව ම ගෙවල් දොරවල්, ඉඩකඩම්, බඩුමුට්ටු පින්වතුන්ට භාවිතා කළ හැකි යි කිසි ම වෙනසක් නැතුව. භාවිතා කරන පුද්ගලයා නිර්මාණය වෙනවා ඉබේ ම. මේ පුද්ගලයා ඔය කෑලි ටික එල්ලගෙන තියෙන්නේ. පෙනෙන, ඇහෙන කෑලි ටික රඳවාගෙන ඉන්නේ මේ පුද්ගලයා යි. පුද්ගලයා රැඳිලා තියෙන්නේ දකින, අහන කෑලි ටිකෙන්. **දකින දේ තියෙනවා කියලා පින්වතුන්ට තේරෙන තාක් පුද්ගලයා ඉන්නවා. අහන දේ තියනවා කියලා තේරෙන තාක් පුද්ගලයා ඉන්නවා. පුද්ගලයා නිසා යි පෙනෙන ඇහෙන දේ තියනවා කියලා තේරෙන්නේ. පෙනෙන ඇහෙන දේ තියෙන තාක් පුද්ගලයා ඉන්නවා.** ජාතිඤ්ච පජානාති කියන කොට එයා දන්නවා, මේ සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීම තමයි ජාතිය.

උපන්නොත් උපන්න කෙනාට ජරාමරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෙමනස්ස, උපායාස කියන සියලු දුක් ටික විඳින්නත් වෙනවා. මේ පුද්ගලයා උපන්නා කියන්නේ පින්වතුන්ට දුක උපන්නා. **මේ උපන්නේ තමන්ව නෙවෙයි, දුක යි උපන්නේ හොඳට තේරුම්ගන්න. මේ පෝෂණය කරන්නේ, මේ ජීවත් කරන්නේ දුක යි.** නින්ද, අපහාස, ඇණුම් බැණුම්, තාඩන, පීඩන, හිත් වේදනා, වෙනස්කම්, හින්ට් ගැහුවා ඔය වගේ දේවල් එනව ද? නැත් ද? ඔය දුක් එන්නේ කාට ද? පුද්ගලයාට යි. ලෙඩ වීම, මහලු බව, මරණය කියන මේ දුක් ලැබෙන්නේ කාට ද? පුද්ගලයාට යි. ජාතිය ගැන එයා දන්නවා හොඳට. මොකක් ද? ජාතිය කියලා කියන්නේ දුකට තව නමක්. දුක කියලා කියන්නේ ඉපදීමට තව නමක් කියලාත් දන්නවා.

- ඉපදීම පිරිසිඳ දකින්න නම්, ඉපදීම දුකක් කියන තැනකින් හඳුනා ගන්නවා එයා. ඒ කියන්නේ මේ සතරමහාධාතු රූපය

මම කරලා, මගේ කරලා, මේ ඉපදීම, ඒකාන්තයෙන් ජරාමරණ දුකේ ඉපදීම යි කියලාත් දන්නවා.

- ඒ වගේ ම ජාතිය පිරිසිඳ දකින්න නම්, ජාතිය ඇති වෙච්ච හැටිත් දන්නවා. ඇස් ඉදිරිපිටට එන අරමුණු කෙරෙහි, තණ්හා උපාදන වශයෙන් පැවතුණු නිසා යි භවය හැදුනේ. ඒ කියන්නේ දැකපු, අහපු දේවල් මතකයේ හිටියේ, ඒවා තියනවා වගේ ඇති බවට සිහිකරන්න පුළුවන් බවට පත් වුණේ. ඒ නිසා යි මේ පුද්ගලභාවය කියලාත් දන්නවා. පුද්ගලභාවය දුක යි. මේ පුද්ගලභාවයේ ඉපදීම යි දුක කියලාත් දන්නවා. ඒ පුද්ගලභාවය ඇති වුණේ භවය නිසා යි කියලාත් දන්නවා.
- භවය කුමක් නිසා ද? ස්පර්ශ වෙන, වේදනාව එන අරමුණු කෙරෙහි, තණ්හා උපාදන වශයෙන් ගත්ත නිසා යි කියලාත් දන්නවා. ඒක යි තණ්හාව දුකට හේතු යි කියලා කියන්නේ. එයා ජාතියත් දන්නවා. ජාතිය දන්න කොට ජාති සමුදයත් දන්නවා.
- *ජාති නිරොධඤ්ච පජානාති*, යම් වෙලාවක ඇස් ඉදිරිපිටට, කන ඉදිරිපිටට එන අරමුණු කෙරෙහි රස විඳ ගැනීම් අනුව බලන්නේ නැත්නම්, පෙනෙන ඇහෙන අරමුණු තණ්හා, උපාදන වශයෙන් නො ගත්තොත් වෙන්නේ මොකක් ද? *භව නිරොධො*. දැකපු දේ ඇති බවට මනසේ හැපිලා හිටින්නේ නෑ. අහපු දේ ඇති බවට මනසේ හැපිලා හිටින්නේ නෑ. ගඳ/සුවඳ ආඝ්‍රාණය කරපු, රස විඳපු, ස්පර්ශය ලබපු දේ ඇති බවට මනසේ හැපිලා හිටින්නේ නෑ.
- එහෙම භවය නැති වුණොත් තියන ආනිසංසය මොකක් ද? ජාතිය නිරුද්ධ වෙනවා. මේ පුද්ගලයාගේ ඉපදීම නැති වෙනවා. පුද්ගලයාගේ ඉපදීම නැති වුණොත් මොකද වෙන්නේ? අජරාමර යි. ජරා මරණයට පත්වෙන්නෙක් නෑ. ජරා මරණ දුක එන්නේ නෑ. ඉපදීම නැති වුණොත් ජරා මරණ දුක, *සෝක, පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාසා නිරුජ්ඣන්ති* කියලාත් දන්නවා. මේ පුද්ගලයෙකුට විඳින්න

තියන සියලු දුකින් නිදහස් වෙනවා කියලාත් දන්නවා. දැනගෙන ජාති නිරෝධ ගාමිනි පටිපද - ජාතිය නැති කරන ප්‍රතිපදාවක් එයා පුරනවා, මොකක් ද? සම්මා දිට්ඨි.

- ඇස් ඉදිරිපිටට එන රූපයේ, කන ඉදිරිපිටට එන ශබ්දයේ ඇත්ත ඇතිහැටිය නුවණින් දකින්න උත්සාහවත් වෙනවා. ඇස් ඉදිරිපිටට, කන ඉදිරිපිටට, නාසය ඉදිරිපිටට එන අරමුණුවල ඇත්ත ඇතිහැටිය බලන්නේ ඇයි එයා? චතුරාර්ය සත්‍යය දන්නා නුවණ නිසා යි.

මොකක් ද චතුරාර්ය සත්‍යය? ජාතිය කියලා කිව්වේ දුක්ඛ සත්‍යයට නමක්. *ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යං පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා.* ඉපදුනා නම් ඉපදුන කෙනාට ලෙඩවීම. මහලුවීම, මරණය, සෝකය, පරිදේවය, දැඩි වෙහෙස මේ සියලු දුක් ටික විඳින්න වෙනවා. මේ මොකක් ද? දුක යි. දුක්ඛ සත්‍යය දන්නවා. මේ චතුරාර්ය සත්‍යය මේ සාසනයට විතරයි කියලා කියන්නේ අනිත් ලෝකයේ ඔක්කෝම දකින්නේ ඉපදීම මව්කුසින්. නමුත් **ශ්‍රැතවත් ආර්ය ශ්‍රවකයා දන්නවා *තණ්හං ජනෙති පුරුසො*[7], මේ පුරුෂයාව ඉපැද්දුවේ තණ්හාවෙන්. මේ පුරුෂයාව උපද්දලා තියෙන්නේ කෙලේසයකින්. මේ තමන්ව නිර්මාණය වෙලා තියෙන්නේ කෙලේසයකින් කියලා දන්නවා. අවිද්‍යා, භවතණ්හා කියලා මූලක්ලේශ දෙකෙන් මේ තමන්ව නිර්මාණය වෙලා තියෙන්නේ.**

එතකොට මේ තමන්ගේ ඉපදීම තමයි දුක. මේකේ ආශ්වාදයක් නැතුවත් නෙවෙයි. තමන්ට දරුවන්ගේ මූණ බලලා සතුටු වෙන්න පුළුවන්, තමන්ගේ ඉඩකඩම් සිහි කරලා සතුටු වෙන්න පුළුවන්, තමන්ට තියන යානවාහන සිහි කරලා පුද්ගලයාට සතුටු වෙන්න පුළුවන්. මේ පුද්ගලභාවය නිසා එන ආශ්වාදය යි. ඒ වගේ තමයි ආදීනව බොහෝ යි. පුද්ගලයෙකුට මේ අරමුණු වලින් ලැබෙන

---

[7] කාමසුත්තනිද්දෙසො, මහානිද්දෙසපාළි, ඛුද්දක නිකාය

ආශ්වාදය වගේ ම, ඊට වඩා සිය දහස් ගුණයකින් යුක්ත ආදීනවයක් විඳින්න වෙයි. මේ අරමුණු කෙරෙහි සතුටු වෙලා පුද්ගලයා නිර්මාණය කරගත්තහම, ඒ පුද්ගලයාටම ඒ සතුටු වෙච්ච විදිහටම අරමුණේ දුක් විඳින්නත් වෙනවා. දුක වළක්වන්න බෑ ඉපදුනොත්.

එතකොට ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා දන්නවා **මේ පුද්ගලභාවයේ ඉපදීම යි දුකේ ඉපදීම කියලාත් දන්නවා.**

එතකොට ඒ දුක හැදුනු හැටිත් දන්නවා. ඇසට රූපයක් පෙනෙනවා කියන තැන තියෙන්නේ ස්කන්ධ ටිකක්, පුද්ගලයෙක්ගේ, සත්ත්වයෙක්ගේ නෙවෙයි. ඒ පෙනෙන රූපයට තණ්හා, උපාදාන කියන කෙලෙස් ටික පතිත වුණහම තියන දෝෂය, ඇස අනිත්‍ය වෙනවා, රූපය අනිත්‍ය වෙනවා. චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය වෙනවා. අනිත්‍ය වුණාට ඒ ඇස ඇති බවට, රූපය ඇති බවට, චක්ඛු විඤ්ඤාණය ඇති බවට මනස තුළ හැපිලා පවතිනවා. ඒකට තමයි භවය කිව්වේ. අන්න ඒ **භවයයි මේ ඉපදීමට හේතුව කියලා දන්නවා.**

**භවයට හේතුව තණ්හා, උපාදාන යි කියන එක දන්නවා.**

**තණ්හා, උපාදානයට හේතුව වේදනාව කියලා කිව්වේ, මේ ඇස් ඉදිරිපිටට ආපු වස්තූන් කෙරෙහි ආපු වේදනා ගෙනත් දුන්න ආයතන ටික තමයි ස්කන්ධ ටික.**

**ඒ ටික කෙරෙහි තණ්හා, උපාදාන වශයෙන් පැවතීමේ දෝෂය, භවය - දැකපු දේ ඇති බවට හිටියා. ඒකේ දෝෂය පුද්ගලයා නිර්මාණය වුණා කියලා දකින කොට දුක යි, දුක්ඛ සමුදය යි දෙක දකිනවා.**

*චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණ, සොක, පරිදෙව, දුක්ඛ, දෙමනස්සුපායාසා*

*සම්භවන්ති.* බුදුරජාණන්වහන්සේ පෙන්නුවේ එහෙම යි. ඇස යි, රූපය යි, චක්ඛු විඤ්ඤාණ යයි තුන් දෙනාගේ එකතුවට කියනවා ස්පර්ශය. ස්පර්ශ වෙච්ච අරමුණ විඳිනවා. විඳින අරමුණට තණ්හා, උපාදන වෙනවා. වේදනාවට විතරක් නෙවෙයි. වේදනාව ආව රූපයට. තමන්ට ප්‍රිය වේදනාවක් එනවා නම් වේදනාව එන රූපය වෙන්න පුළුවන්, ඒ වේදනාව වෙන්න පුළුවන්, ඒ සංඥාව වෙන්න පුළුවන්, ඒ සංඛාරය වෙන්න පුළුවන්, ඒ විඤ්ඤාණය වෙන්න පුළුවන් - ස්කන්ධ පංචකයෙන් කොයි එකක් ආවත් වේදනාව අරමුණු කරගෙන යි තියෙන්නේ.

ඇස් ඉදිරිපිට තමන්ට විඳින්න හම්බවෙන අරමුණට කැමති යි, මේ මගේ දරුවා කියලා හිතාගෙන ඉන්නේ - තණ්හා, උපාදන දෙක. එතකොට තියෙන්නේ මොකක් ද? ***චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො*** - **ස්පර්ශය නිසා වේදනාවක් එනවා. තණ්හාව - ඒකට කැමති යි, උපාදන යි - මේ මගේ දරුවා කියලා පෙනෙන දෙයට. *වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදන, උපාදන පච්චයා භව*, හැම වෙලාවේ ම ඉඳගෙන, හිටගෙන, නිදගෙන, ඇවිදින හතර ඉරියව්වේ ම තමන්ට දරුවා ඇති බව ම යි පෙනෙන්නේ. දරුවෙක් ඉන්න බව තමයි තේරෙන්නේ. භව පච්චයා ජාති, ඒ දරුවාට අයිතිකාර පියා, නැත්නම් අයිතිකාර කෙනාත් ඉන්නවා එතකොට. අයිතිකරුවා නැතිවෙන්නේ නෑ. ඉඳගෙන, හිටගෙන, නිදගෙන, ඇවිදින හතර ඉරියව්වේ ම කෙනා ඉන්නවා. පුද්ගලයා ඉන්න කොට පුද්ගලයාට සියලු දුක් විඳින්න වෙනවා.**

***චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො,*** **තුන් දෙනාගේ ස්පර්ශය යි. එතන ස්කන්ධ ටික. ඒ ස්පර්ශ ආයතනය පිරිසිඳ දැකලා තණ්හාව ඇති නො වෙන විදිහට කටයුතු කළොත්, උපාදනය නෑ. එහෙම වුණොත් භවය නෑ. දැකපු දේ ඇති බවට මනසේ හැපී හිටින්නේ නෑ. එහෙම වුණොත් ජාතිය නෑ. ඉපදීම නෑ. පුද්ගලයාගේ ඉපදීම වෙන්නේ නෑ. මේ මම කියලා හිතන්න පුළුවන් කෙනෙක් හම්බවෙන්නේ නෑ. ඉපදීම නැති වුණොත් මොකද වෙන්නේ? *ජරා මරණ, සොක, පරිදෙව,***

*දුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති.* ඔය මරණින් පස්සේ සිද්ධියක් ද කියන්නේ? තණ්හාව නැති කළොත්, උපාදනය නැති කළොත්, භවය නෑ. එහෙම වුණොත් පුද්ගලයාගේ ඉපදීම නෑ. පුද්ගලයාගේ ඉපදිම නෑ කියලා කියන්නේ මොකක් ද? දුක් විඳින්න තියන හේතුව නෑ. *ජාති නිරෝධා ජරා මරණ, සොක, පරිදෙව, දුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති.* ජරා මරණයාගේ නිරෝධයට කියන තව නමක් මොකක් ද? අජරාමර බව. 'අජර' කියන්නේ ජරාවක් නෑ. 'අමර' කියන්නේ මරණයක් නෑ. ඒකයි දුකට හේතුව තණ්හාව. තණ්හාව නැති කිරීම නිවන කියලා පෙන්නන්නේ. තණ්හාව නැති වුණොත් ඉපදීම නැති වෙනවා.

ඔන්න දැන් එයා හොඳට දන්නවා තමන් උපන්න කෙනෙක් කියලා. තමන්ව උපද්දවා ගත්තෙත් කොහොම ද කියලා දන්නවා. මේ ස්පර්ශ ආයතන හයේ ඇත්ත ඇතිහැටිය නො දැන, මේවට තණ්හා උපාදන වෙච්ච නිසා යි භවය හැදුනේ, ඒ නිසා යි මේ ඉපදීම. ජරාමරණ දුක නැති කරන්න මොන විදිහටවත් බෑ, ඉපදීම තියනවා නම්. ඉපදීම තියනවා නම්, ජරා මරණ දුක එනවා ම යි.

ඉපදීම නැති කරන්න කිසිදු ක්‍රමයක් නෑ භවය තිබුනොත්. දැකපු, අහපු දේ දැකපු, අහපු බවෙන් ඉවර වෙන්නේ නැතුව, ඇති බවට මනසේ හැපී හිටින තාක්, ජාතිය වෙනවා ම යි. ඒ කියන්නේ භවය වුණොත්, ජාතිය වෙනවා ම යි. පෙනෙන අරමුණ උපාදන වශයෙන් ගන්න තාක් භවය නතර වෙන්නේ නෑ. පෙනෙන අරමුණුවල වටිනාකම, පෙනෙන අරමුණු වලට තණ්හාව ඇති තාක්, ඇසට පෙනෙන අරමුණු වල තණ්හාව ඇති තාක් උපාදන වෙනවා කියන එක නතර වෙන්නේ නෑ. පෙනෙන අරමුණු වල වටිනාකම දැනෙන තාක් තණ්හාව නතර වෙන්නේ නෑ. ඒ නිසා **සම්මා දිට්ඨි - පෙනෙන අරමුණේ ඇත්ත ඇතිහැටිය දැක්කොත්, පෙනෙන ඇහෙන අරමුණුවල වටිනාකම නැති වෙනවා. වටිනාකම නැති වුණොත් තණ්හාව නැති වෙනවා. තණ්හාව නැති වුණොත් දැඩිව ගන්න එක (උපාදනය) නැති වෙනවා. උපාදනය නැති වුණොත් භවය නෑ. මේ ඔක්කෝම තියනවා, ඉන්නවා කියලා මනසේ එල්ලගෙන ඉන්න මල්ලක් පුරවාගෙන ඉන්නේ නෑ. ඔළුවේ**

**එල්ලගෙන ඉන්නේ නෑ. අම්මා, තාත්තා, අයියා, අක්කා, දුවා, පුතා බාහිර ඉන්නවා කියලා මනසෙන් එල්ලගෙන මෙතන ඉඳගෙන ඉන්නේ නෑ. මනසෙන් එල්ලගෙන මෙතන ඉඳගෙන ඉන්න එකට යි භවය කියලා කියන්නේ. ඒ නිසා යි ඉඳගෙන ඉන්න ඇත්තන්ව පෙනෙන්නේ. තණ්හාව නැති වුණොත් භවය නෑ. මනසේ එල්ලගෙන ඉන්න ගතිය නෑ. භවය නැති වුණොත් ජාතිය නෑ. ඉඳගෙන ඉන්න පුද්ගලයෙක්, නිදාගෙන ඉන්න පුද්ගලයෙක්, ඇවිදින පුද්ගලයෙක්, හිටගෙන ඉන්න පුද්ගලයෙක් ලැබෙන්නෙ නෑ. ඉඳගෙන, නිදාගෙන, ඇවිදින, හිටගෙන හතර ඉරියව්වේ ම ඉන්න පුද්ගලභාවයෙන් මිදිච්ච කෙනෙක්. නූපන්න කෙනෙක්. නො හටගත්ත කෙනෙක්. කෙනෙක් කියලා ඒක මම මේ ව්‍යවහාර කරන්නේ. පුද්ගලභාවය නූපදිනවා. පුද්ගලභාවය නො හටගන්නවා. පුද්ගලභාවයේ නූපදීමට කියනවා ජාති නිරොධො. ඉපදීම නැතිවෙලා. කෙනෙක්ගේ ඉපදීම නැතිවෙලා. ඉපදීම නැතිවෙන කොට ජරා මරණ දුක නිරුද්ධ වෙනවා.**

දුක එපා නම්, අකමැති නම්, දුක නැති කරන්න තියන ක්‍රමය ඔන්න ඕක යි. දුක ඇතිවෙච්ච ක්‍රමය බලාගෙන යන්න. ඒ ක්‍රමයට ම විතරයි දුක නැතිකරන්න තියෙන්නේ. වෙන්නේ. වෙන ක්‍රමයක් නෑ. හොඳට මතක තබාගන්න. ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දොමනස්ස, උපායාස - ජරාව කියන්නේ මොකක් ද? වයසට යෑම. ඇස් පෙන්නේ නෑ, කන් ඇහෙන්නේ නෑ, අතපය වලංගු නෑ, හම රැලි වැටිලා. මේ වගේ දිරන ස්වභාවයට පත්වෙන්නෙක් වීම - ජරාව. තමන් චේවා, තමන්ගේ චේවා කෙනෙක් මැරීම හෝ මරණය නිසා එන දුක - මරණය. ඒ වගේම නොයෙක් ලෙඩ රෝග හැදීමේ දුක - ව්‍යාධිය. මේවා ඔක්කෝම පුද්ගලයෙකුට උරුමවෙන දේවල්. නම කිය කියා අඬනවා, ගුණ කිය කියා අඬනවා අනේ මගේ අම්මා, අම්මා ඉන්න කොට මට මෙහෙම කන්න දුන්නා, බොන්න දුන්නා, මගේ රෙදි හෝදලා දුන්නා. දැන් මගේ අම්මා නෑ නේ ද කියලා අඬනවා නේ? ඒ අඬන්නේ ඒ දුක දැනෙන්නෙත් පුද්ගලයාට යි. කෙනාට යි. අනේ මගේ දරුවා නැති වුණා නේ ද, මගේ දරුවාට මේ ලෙඩේ හැදුනා නේ ද කියලා දරු දුක එන්නෙත්

කෙනාට යි. අසාධාරණකම් වෙන්නෙත් කෙනාට යි. මේ ඔක්කෝම පුද්ගලයාගේ ඉපදීම නිසා උරුමවෙන දේවල් - දුක. ඕන්න දුක, ඉපදීම නිසා යි. හොඳට මතක තබාගන්න. ඉපදීම කියන කොට සිහිකර ගන්න එපා මව්කුසින් ඉපදීම ම.

මේ සතරමහාධාතු රූප මිටිය කෙනෙක් කරලා, මම කරලා - දැන් මෙතන ඉන්න කොට බැරිවෙලා වාතයක් එහෙම ගියොත්, ලැජ්ජා හිතෙනව ද නැත් ද? කාට ද ලැජ්ජා හිතෙන්නේ? මට. අන්න පුද්ගලයා. හොඳට අල්ලගන්න පුද්ගලයාව. මෙන්න මේ උපන්න කෙනාට තමයි ඒ දුක ආවේ. ඒ ලැජ්ජාව ආවේ. එයයි කෙනා. බොහෝම සියුම් ධර්මයක්. මේක රූප මිටියකට තියලා බලන්න එපා.

මම කිව්වේ ඇස් ඉදිරිපිටට එන රූපවාහිනී තිරයක් ගන්න. ඇස් ඉදිරිපිටට එන රූපය අනාත්ම යි නේ. නේ ද? හරි. පින්වතුන්ට ඒක ඇතුලෙත් සත්ත්වයින් පෙනෙනවා ද නැත් ද? ඒකේ ඇතුලේ මිනිස්සු ඉන්නවා කියලා පෙනෙනව ද නැත් ද? ටී.වී. එක බලන කොට මිනිස්සු ලෙඩ වෙලා, මහලුවෙලා, මැරිලා දුක ඇවිල්ලා නැත් ද? ඇවිල්ලා තියනවා. හොඳයි, මට කියන්න පින්වතුන්ට පෙනෙනවා නේ සත්ත්වයන් පුද්ගලයන් ටී.වී. එකේ? ඒ සත්ත්වයා මරණින් පස්සේ කොහාට යයි ද? එහෙම කියන්න සුදුසු ද? නැහැ. එහෙනම් කොහේ ඉඳන් එන්න ඇද්ද ඒ සත්ත්වයන්? ටී.වී. එක ඇතුලේ චිත්‍රපටියක් බලන කොට ළමයි, පිරිමි, ස්ත්‍රී, වයසක අය, තරුණ අය පෙනෙනවා ද නැත් ද? සත්ත්වයන්, පුද්ගලයන් පෙනෙනවා ද නැත් ද? පෙනෙනවා. අහන්න සුදුසු ද මේ සත්ත්වයා කොහෙ ඉඳන් එන්න ඇත් ද? එහෙනම් කොහාට යයි ද මැරිලා, කියලා අහන්න සුදුසු ද? නෑ. **හොඳට දන්නවා අනාත්ම රූපයට මගේ කෙලෙස් ටික පතිත වෙලා පුද්ගලයෙක් නිර්මාණය කරගෙන තියෙන්නේ. පුද්ගලයා හදගත්ත එකක් මිසක කොහෙ ඉඳන් ආවා වත්, කොහේට වත් යනවා වත් නෙවෙයි.** ඒ වගේ මේ ඉදිරියෙන් තියන රූප ටිකට, මගේ කෙලෙස් ටික පතිත කරලා, තමන්ව උපදවා ගත්තා නම් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයාට හොඳට නුවණ යි, ස්කන්ධ ටිකට කෙලෙස් ටික තබලා, තණ්හා උපාදාන

කියන කමින්, භවය හැදුවා. භවය නිසා ජාතිය වෙනවා කියලා දකින කොට, මරණින් පස්සේ යනව ද? යනවා නම් කොහාට යනවා ද මේ සත්ත්වයා? කොහොම උපදියි ද? දෘෂ්ටි නෑ. කොහේ ඉඳන් මේ සත්ත්වයා එන්න ඇත් ද? කොහේ ඉන්න ඇත් ද? හිටියා නම් කොහෙ ඉන්න ඇත් ද? එබඳු දෘෂ්ටි නෑ. ඇයි ඒ? **එයා දන්නවා ජාතිය කියන එක මේ ස්කන්ධ ටිකේ ඇත්ත නො දන්නාකම නිසා දූන් උපදවා ගත්ත සිද්ධාන්තයක් මිසක් කෙහෙන්වත් ආපු එකක්වත්, කොහාටවත් යන එකක්වත් නෙවෙයි කියන එක පැහැදිලි ආර්ය ශ්‍රාවකයාට.**

මච්කුසින් ඉපදීම දකින කෙනා තමයි එහා පැත්තේ ලෝකයේ ඉඳලා එන්න ඇති, ආපු කෙනා එහා පැත්තට යයි කියලා කියන්නේ. ඒ නිසා හොඳට තේරුම් ගන්න මේ කාරණාව. ජීවත්ව ඉද්දි ම 'අජරාමර' වෙන්න පුළුවනුත් ඒක යි. මේ ස්කන්ධ ටික පරිහරණය කරද්දි ම, 'අජර අමර' කියන්නේ මොකක් ද? 'අජර' කිව්වේ ජරාවක් නැහැ. 'අමර' කිව්වේ මරණයක් නැහැ. ජරා මරණ නැති කරන්න පුළුවන් වෙන්නේ මොකක් වුණොත් ද? ඉපදීම තියාගෙන ජරා මරණ නැති කරන්න පුළුවන් ද? ඉපදීම නැති කළොත් විතරම ම යි නේ ද අජරාමර වෙන්න පුළුවන්? එහෙනම් ස්කන්ධ ටික තියෙද්දි ම අජරාමර වෙනවා කියන්නේ, ස්කන්ධ ටික තියෙද්දි ම ජාතිය නැති කරලා, ඉපදීම නැති කරලා නේ? ඒ කාගේ ඉපදීම ද? පුද්ගලභාවයේ ඉපදීම. සත්ත්වයාගේ ඉපදීම. ඔන්න ඔය පුද්ගලභාවයේ ඉපදීම, සත්ත්වයාගේ ඉපදීම නැති කරපු තැනට තමයි සෝපදිසේස නිබ්බාන කියන්නේ. රහතන්වහන්සේ කියන්නේ. පුද්ගලභාවය නැති කරලා, පුද්ගලභාවය නිසා එන ජරා, මරණ දුකත් නැති කරලා ස්කන්ධ ටික විතරක් පරිහරණය කරනවා.

පුද්ගලභාවය, මේ භවය නැති කළ නිසා ම මතු ස්කන්ධයන්ගේ හටගැනීමක් වෙන්නෙත් නෑ. ඒ නිසා ඒකට කියනවා අනුපදිසේස නිර්වානය කියලා.

නිවන කොටස් දෙකකට බෙදන්නේ ජාතිය දෙ ආකාරයකින් තියන නිසා යි.

සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීම තියන නිසා ලෝකයක් පනවනවා. භවය නිසා ම සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීමත් වෙනවා, මතු ස්කන්ධයන්ගේ ඉපදීමත් වෙනවා. *භව නිරොධො ජාති නිරොධො*, භවය නැති වුණොත් සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීමත් නැති වෙනවා. සත්ත්ව පුද්ගලභාවයේ ඉපදීම නැති වුණොත් මොකද වෙන්නේ? ඒකට කියනවා සෝපදිසේස නිබ්බාන. කෙලෙස් ටික නැති කළ නිසා ම, පුද්ගලභාවය නැතිවෙච්ච නිසා ම මතු ස්කන්ධයන්ගේ හටගැනීමත් නැති වෙනවා.

එතකොට ඉපදීම දුකක් කියලා කිව්වේ උපන්න කෙනාට විඳින්න වෙන ආදීනව බොහෝ යි. මේ ජීවිතයේ විතරක් නෙවෙයි. ආශ්වාදය ටිකයි ආදීනව ගොඩයි කියන්නේ, මම මෙබඳු නිලයක් දරන කෙනක් කියලා සතුටු වුණ හැකි යි. මට මෙච්චර දේපලක් තියනවා කියලා සතුටු වුණ හැකි යි. මට මේ වගේ ගෙවල් තියනවා කියලා සතුටු වුණ හැකි යි. මට දරුමල්ලෝ මෙච්චර ඉන්නවා කියලා සතුටු වුණ හැකි යි පුද්ගලයෙකුට. පුද්ගලභාවය උපද්දවාගෙන පුද්ගලභාවයෙන් සතුටුවෙන එකට තමයි බුදුරජාණන්වහන්සේ පෙන්නන්නේ කුෂ්ඨ රෝගියෙක් කුෂ්ඨයක් කසනවා වගේ කියලා. කසන කොට සැප යි. නමුත් ඒ තමන්ගේ නිලතල නැතිවෙන කොට, දේපල වස්තුව නැතිවෙන කොට, කැඩෙන කොට, බිඳෙන කොටත් දුක එනවා. ඊට පස්සේ නින්දා අපහාස, ඇණුම් බැණුම්, තාඩන පීඩන නිසාත් දුක එනවා. ඒ තමන් කියලා දකින ශරීරය ජරාජීර්ණ වෙන කොට, ලෙඩ රෝග හැදෙන කොට, මැරෙන කොට, නැසෙන කොටත් දුක එනවා. ඒ විතරක් නෙවෙයි, ඒ පුද්ගලභාවය ම හේතු කරගෙන හීන ධාතුවේ විඤ්ඤාණයත් පිහිටනවා. නැවතත් ස්කන්ධයන්ගේ හටගැනීමකුත් වෙනවා. ස්කන්ධයන්ගේ හටගැනීමේ දුකත් විඳින්න වෙනවා. කෙලෙස් ඇතත්, නැතත් මේ කයක් සවිඤ්ඤාණක වුණොත් සීතෙන් පීඩා විඳින්න වෙනවා, උෂ්ණෙන් පීඩා විඳින්න වෙනවා, මැසි මදුරු, අව් සුළං මේ සියලු ම දුක් ටික විඳින්න වෙනවා. කෙලෙස් ටික නිසා විඳින දුක් පැත්තකින් තැබ්බොත්, මේ කයක් සවිඤ්ඤාණක වුණොත් ඒ නිසාත් දුක් විඳින්න වෙනවා. ඒ දුක්

ටිකත් අයිති යි. පුද්ගලභාවය නිසා ස්කන්ධයන්ගේ හටගැනීමේ දුක් ටිකත් විඳින්න වෙනවා. අපා දුක් ටිකත් විඳින්න වෙනවා. පුද්ගලභාවය නිසා එන අනිත් සියලු දුක් ටිකත් විඳින්න වෙනවා. පුද්ගලභාවයෙන් සතුටු වෙන්න තියෙන්නේ බොහෝ ම ටිකයි, දුක් විඳින්න තියනවා ගොඩාක්. ඔන්න පුද්ගලභාවයේ ආශ්වාදය යි, ආදීනවය යි දෙක මැනගන්න.

ඒකට හේතුව භවය. දකින අහන දේවල්, නැත්නම් ජීවිතය පුරාවට ම දැකපු, අහපු දේවල් මනසින් එල්ලගෙන ඉඳගෙන ඉන්න ඉරියව්වේ ඉඳගන්නවා, හිටගෙන ඉන්න ඉරියව්වේ හිටගන්නවා, ඇවිදින ඉරියව්වේ ඇවිදිනවා, නිදාගන්න ඉරියව්වේ නිදාගන්නවා. ඔන්න ඔය ගෙවල් දොරවල්, යානවාහන, ඉඩකඩම් ඔක්කොම ඔළුවේ එල්ලගෙන, දැන් මෙහෙම ඉඳගෙන ඉන්නවා, පින්වතුන්ට අම්මා, තාත්තා, දුව, අයියා, අක්කා, ගෙවල්, වාහන තියනවා කියන හැඟීම තියනවා ද නැත් ද? ලෝකය ම එල්ලගෙන ඉඳගෙන ඉන්නේ. ඒකට තමයි පින්වතුන්ට භවය කියලා කියන්නේ. ඒ නිසා යි කෙනා. එකම දේ නැවත නැවත කියන්නේ මේක තේරුම්ගන්න. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින පින්වතුන් එක්ක මුළු ලෝකයක් ම එල්ලිලා තියෙන්නේ පෙනෙන ඇහෙන අවස්ථාවේ දී ඒවා තණ්හා, උපාදාන වශයෙන් ගත්ත නිසා යි. ගත්තේ පෙනෙන ඇහෙන දේ තුළ ඇත්ත නො දැක්ක නිසා යි. ඇත්ත නො දැක්ක නිසා තණ්හා, උපාදාන වෙලා ඒ නිසා, (මේ වචන වලට තමන් අර්ථ තබාගන්න) පෙනෙන ඇහෙන දෙයට තණ්හා, උපාදාන කියන කොට - ඒවායේ වටිනාකම් දැනෙන කම, ඒවා මම, මගේ කියලා උරුම කරගන්න හිතන කම. ඒ නිසා භවය කියන කොට - සිහි කරගන්න දැකපු, අහපු හැම දෙයක් ම ඇති බවට තමන්ගේ මනසේ හැපිලා තියන කම ඉඳගෙන, හිටගෙන, නිදාගෙන හිටියත් ඇති බවට මනසේ එල්ලගෙන ඉන්න කමට යි භව කියලා කිව්වේ. භව පච්චයා ජාති කියන කොට - සිහි කරගන්න මේ කය තමන් හැටියට පෙනෙන, පුද්ගලයෙක් හැටියට පෙන්නන කම තව සත්ත්වයන්, තව පුද්ගලයන් හැටියට පෙන්නනකමට යි ජාති කියලා කිව්වේ. ඒ නිසා යි ජරා මරණ දුක.

**යම්කිසි කෙනෙකුට දුක නැති වෙන්න ඉපදීම නැතිවෙන්න ඕනේ. ඉපදීම නැති වෙන්න භවය නැති වෙන්න ඕනේ. භවය නැති වෙන්න උපාදාන, තණ්හා නැති වෙන්න ඕනේ. එහෙම වෙන්න නම් පෙනෙන ඇහෙන අරමුණේ ඇත්ත ඇතිහැටිය දකින්න ඕනේ. ඔන්න නිරෝධ සත්‍යය. එයා ජාති නිරෝධයත් දන්නවා.**

*ජාති නිරොධ ගාමිනි පටිපද* - ජාතිය නැති කිරීමේ ප්‍රතිපදාව පුරණවා, සම්මා දිට්ඨි. මොකක් ද සම්මා දිට්ඨි? හැම වෙලාවේ ම **ඇත්ත ඇතිහැටිය දකිනවා. ඇස් ඉදිරිපිටට හම්බවෙන රූපය අනිත්‍ය බව හෝ දුක් බව හෝ අනාත්ම බව හෝ බලනවා. බලන කොට රූපයේ අනිමිත්ත බව හෝ සුඤ්ඤත බව හෝ අප්පණිහිත බව හොඳට තේරෙනවා. අන්න ඒ අනිමිත්ත බව, සුඤ්ඤත බව, අප්පණිහිත බවට තමයි සම්මා දිට්ඨි කියලා කිව්වේ.** අන්න ඒ දර්ශනයට *සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති, සබ්බං අවිජ්ජං පරියාදියති, සබ්බං අස්මිමානං සමූහනති*[8]. සියලු කාම රාගය ගෙවනවා, රූප රාගය ගෙවනවා, අරූප රාගය ගෙවනවා, භව රාගය ගෙවනවා, අස්මිමානය, මේ මම වෙමි කියන හැඟීම ගෙවලා උගුල්ලලා දානවා.

කොහොම ද ඒ රූපය අප අනිත්‍ය, දුක්ඛ, අනාත්ම විදිහට බලන්නේ? ඒක බලන ක්‍රමය, නැත්නම් දුක්ඛ නිරෝධ ගාමිනි ප්‍රතිපදාව තමයි පංචඋපාදානස්කන්ධයේ උදය වැය බලනවා. **මාර්ගය හැටියට තියෙන්නේ පංචඋපාදානස්කන්ධයේ උදය වැය බලන එක විතර යි.** උදය වැය බලන කොට ඒක දකින්න අපහසු නිසා චිත්ත සමථයක් ඇතිවෙන්න සමථ කමටහනකුත් වඩනවා. සිත සමාධි කරගන්න උපකාර පිණිස කය, වචනය දෙක සංවරය ඇති කරගන්න සීලයකත් පිහිටනවා. සීලයක පිහිටලා, සමථ කමටහනකින් සිත වඩමින් ස්කන්ධයන්ගේ උදය වැය බලනවා. උදය වැය බලන කොට එයා උදය වැය බලන්න හේතුව දන්නවා දූන්. චතුරාර්ය සත්‍යය දන්නා නුවණ. මේ ස්කන්ධයන්ගේ උදය

---

[8] අනිච්චසඤ්ඤා සූත්‍රය, පුප්ඵ වග්ගො, ඛන්ධ සංයුත්ත, ඛන්ධවග්ගපාළි, සංයුත්ත නිකාය

වැය බලන කොට රූපයේ, ශබ්දයේ, ගන්ධයේ, රසයේ, ස්පර්ශයේ රස විඳ ගැනීම් අනුව බැලෙන්නේ නෑ. බලන්න ඉඩ නෑ. වෙලාවක් නෑ. පෙනෙන්නේ නෑ. ඉඩ අවකාශ නැහැ.

එහෙම වුණොත් පෙනෙන, ඇහෙන දේවල් මම, මගේ කියලා උපාදන වශයෙන් ගන්න වෙලාවක් නෑ. ඉඩ නෑ. හේතුව නෑ. එහෙම වුණොත් දකපු, අහපු දේවල් ඇති බවට මනසේ රැඳෙන්නේ නෑ. පංචඋපාදනස්කන්ධය රැස්වෙන්නේ නෑ. *අපචයං ගච්චති.* දකපු, අහපු දේවල් ඇති කමක් තිබුනා නම් ඒක ද ගෙවිලා ගනවා මිසක රැස් වෙන්නේ නෑ. පංචඋපාදනස්කන්ධය අපචයට ගියොත් රැස් නො වුණොත්, තිබුණු දේත් ගෙවිලා ගියොත්, ඉපදීම නැති වෙනවා. මේ මමයි කියලා සතරමහාධාතු රූපය මම කරලා පෙන්නන ගතිය හිටින්නේ නෑ. මේ අනිත් සත්ත්වයන් පුද්ගලයන් කියලා සතරමහාධාතු රූපයේ සත්ත්වයන්, පුද්ගලයන් පෙනෙන්නේ නෑ. එහෙම වුණොත් රූපය කැඩුණත්, බිඳුණත්, මම මහළු වුණා, මම ලෙඩ වුණා, මම මැරෙනවා කියලා හැඟීමක් එයාට එන්නේ නෑ. මේ පුද්ගලභාවයේ ඉපදීම නැතිවෙලා සියලු දුක් නැති වෙනවා කියලා නුවණ තියනවා. එහෙම තියන නිසායි ස්කන්ධයන්ගේ උදය වැය බලන්නේ. මම ඒක කෙටියෙන් පින්වතුන්ට කියලා දෙන්නම්.

හුඹහක් ගාවට ගිහිල්ලා අපි හුඹහක් කොටලා මැටි ටිකක් ගන්නවා. මැටි ටික කියන්නේ සත්ත්වයෙක් ද, පුද්ගලයෙක් ද? ඔය පස් ටිකට වතුර ටිකකුත් දලා අනනවා. දැන් මැටි. මේ මැටි කියන්නේ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ආත්මයක් හෝ ආත්මනීය දෙයක් තියෙනවා ද මැටි ටිකේ? නෑ. ධාතු මාත්‍රයක්. ස්වභාවයක්. පඨවි. ඒකෙන් අපි එක එක හැඩතල වලට රූප හදනවා. මොන මොන විදිහට හැදුවත් මැටි ටික අවකාශ ධාතුවේ තියන හැඩ ටිකක් නේ? දැන් ඔය රූප වල මැටි අහුවෙන්නේ නැතුව හැඩය අල්ලන්න පුළුවන් ද අපට? ඒ මැටි වලින් හැදුනු හැඩයත් අයිති, එක එක හැඩවලට පෙනුණාට හැඩයත් අයිති මොකකට ද? මැටි ටිකට යි. මැටි ටික අවකාශ ධාතුවේ රාශි වෙලා තියන හැඩය ඒ.

නේ ද? හැඩය කියලා වෙනම ගන්න පුළුවන් ද? බෑ. මැටි ටික රාශිවෙලා තියන හැඩය යි.

ඔන්න ඇස් ඉදිරිපිටට එන්නේ මැටි වලින් කළ රූපයක්. මැටි වලින් කළ එක හැඩයක්. හොඳට බලන්න.

ඒ මැටි රූපය හිතින් විඳිනවා අපි. හිතින්. අපේ හිතින් මැටි රූපේ හැඩය හඳුනා ගන්නවා. දැන් රූපය මොකක් ද? පඨවි ධාතුව. මැටි. වින්දේ මොකක් ද? මැටි රූපය. හඳුනන්නේ මැටි රූපයේ හැඩය යි. හඳුනන මැටි රූපයේ හැඩයට අප හිතනවා අශ්ව රූපයක් කියලා.

**අර රූපයයි, අප හිතපු ටිකයි, මේ නාමරූප දෙකම එකතු කරලා විඤ්ඤාණය දැනගන්නවා මොකක් ද? අර රූපය අශ්ව රූපයක් කියලා. හොඳට බලන්න මේ දැනුම, පංචඋපාදානස්කන්ධය ඇතිවෙලා තියන හැටි.** ඇස් ඉදිරිපිටට ආවේ මොකක් ද? මැටි රූපය. මැටි රූපය යි හිතින් වින්දේ. විඳපු රූපයේ හැඩය හඳුනා ගන්නවා. හඳුනාගත්ත හැඩයට අප හිතනවා අශ්ව රූපයක් කියලා. ඇස් ඉදිරිපිටට ආපු රූපය යි, ඒ රූපය නිසා හිත හසුරපු නාම ධර්ම ටිකයි, දෙක එකතු කරලා අර රූපය අශ්ව රූපයක් කියලා දැනගන්නවා. **විඤ්ඤාණය මායාවක් කියන්නේ දැනගන්න එක දැන් බොරුවක්.** මම රූපය අශ්ව රූපයක් කියලා දැනගත්තාට මැටි ටික වෙනස් වෙනවා ද? නෑ.

***විඤ්ඤාණ පච්චයා නාමරූපං*** **කියන්නේ දැනගත්ත නාම ධර්ම අරමුණු කරලා යි රූපය දිහා බලන්නේ. කෝ...ටෝච් එක කියලා සිහි කරලා නේ ද හොයන්නේ අපි?** ඒ වගේ අශ්ව රූපය කියන එක සිහි කරලා තමයි රූපය දිහා බලන්නේ. දැන් පින්වතුන්ට ඒ රූපය පෙනෙන්නේ අශ්ව රූපය වගෙ යි. දැන් මැටි ටික පෙනෙනවා ද? නෑ.

මැටි වලින් ම යි හැදුවේ. එකම හුඹහේ මැටි කොටලා. ඒ මැටි ටිකෙන් හදපු තව රූපයක් ඇස් ඉදිරිපිටට එනවා. ඒ රූපය විඳිනවා. හඳුනනවා හිතින් ම. විඳපු අරමුණ හඳුනා ගන්නවා. *යං*

*සඤ්ජානාති තං විතක්කෙති*,[9] ඔන්න ඒකට හිතනවා ස්ත්‍රී රූපයක් කියලා. *යං විතක්කෙති තං පපඤ්චෙති*, ඔන්න ඒක දැන් තමන්ට ප්‍රපංචයක් වෙනවා. ඇස් ඉදිරිපිටට ආපු රූපය යි, ඒ අරමුණ විඳලා හඳුනලා, හඳුනපු දෙයට ස්ත්‍රී රූපයක් කියලා හිතුවේ කව්ද? තමන්. තමන් හිතුවත් නො හිතුවත් මැටි ටික මැටි ම නේ ද? නමුත් දැන් නාමරූප පච්චයා විඤ්ඤාණං, මේ නාමරූප දෙක නිසා දැනගන්නේ අර රූපය ස්ත්‍රී රූපයක් කියලා යි. ඊට පස්සේ ස්ත්‍රී රූපය කියන සංඥාව සිහිකර ගෙන යි අපි රූපය දිහා බලන්නෙත්. විඤ්ඤාණ පච්චයා නාමරූපං කියන්නේ අනිත් පැත්තට යන්නෙත් එහෙම යි. දැන් ඔන්න ඒ රූපය පෙනෙන්නේ කොහොම ද? ස්ත්‍රී රූපයක් වගෙ යි.

ඊළඟට තව මැටි ටිකකින් හදපු රූපයක් ඇස් ඉදිරිපිටට එනවා. ඒ රූපය විඳලා, හඳුනලා, පුරුෂයෙක් කියලා හිතනවා. මේ නාමය යි, අර පෙනුන රූපය යි, දෙක එකට එකතු කරලා විඤ්ඤාණයෙන් දැනගන්නවා ඒ රූපය පුරුෂ රූපයක් කියලා. ඒ දිහා බලනවා. දැන් හොඳට බලන්න අපේ දැනුම් පරාසය, හිතේ ගති එකතු වෙන්න ඉස්සරවෙලා හැම රූපයක ම යථාභූත ස්වභාවය සමාන යි නේ? මොකක් ද තිබුනේ? මැටි යි. නමුත් අපේ දර්ශන පථයට, අපේ දැක්මට ආවට පස්සේ, අපේ හිතේ තියන ගති ටික එකතු වුණාට පස්සේ මට හම්බ වෙනවා බාහිර ස්ත්‍රී රූප, පුරුෂ රූප, අශ්ව රූප හම්බවෙනවා, ඇත් රූප හම්බ වෙනවා. මේ වගේ රූප ගොඩාක් හම්බ වෙයි. දැන් සුළඟ හෝ කිපුනොත්, ජලය හෝ කිපුනොත්, ගින්න හෝ කිපුනොත්, පොළොව හෝ කිපුනොත් මැටි ටික කුඩු කරගෙන යයි. නමුත් මට රිදෙයි කොහොම ද? ස්ත්‍රී රූපය කැඩුනා, අශ්ව රූපය කැඩුනා, පුරුෂ රූපය කැඩුනා කියන තැනකින් දුක එනවා ද නැත් ද? එනවා නේ.

**එතකොට මට ඒ විදිහට දුක් විඳින්න වුණේ ඇයි? වූ දේ වූ විදිහට දකින්නේ නැතුව වැරදියට දැකපු නිසා නේ. මේ ස්කන්ධයන්ගේ උදය වැයෙන් කියන්නේ, මේ ලෝකය අරබයා අපට සතරමහාධාතු**

---

9 මධුපිණ්ඩික සූත්‍රය, මජ්ඣිම නිකාය, මූලපණ්ණාසකපාළි, සීහනාද වග්ගො

**රූපය කෙනෙක්, පුද්ගලයෙක් හැටියට මට දැනුම ආවේ කොහොම ද කියන එක යි දෙන්නේ. ඔය කාරණාව හෙළි වුණහම එයා මේ රූපය පැත්තට යන්නේ නෑ කෙනෙක් කියලා.**

ඒ වගේ පින්වතුන්ට නෑදෑයෝ ඉන්නවා නේ, අම්මා, තාත්තා, අයියා, අක්කා, දුව, පුතා කියලා යම් තාක් නෑදෑයින් ඉන්නවා නම්, ඔය ඉන්න නෑදෑයන්ගේ රූපයට අපි යොමු වෙමු. අර මැටි ටික වගේ. හැම රූපයක් ම පින්වතුන් පිළිගන්නවා ද කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර කියන පඨවි කොටස් විස්සක් තියෙනවා කියන එක? අයියා කියන තැනත් තියනවා, තාත්තා කියන තැනත් තියනවා, නංගි කියන තැනත් තියනවා, පුංචි අම්මා කියන තැනත්, දුව කියන තැනත්, මම කියන තැනත් ඔක්කොට ම තියනවා නේ? ඒ කොටස් විස්ස පඨවි ධාතු නේ? පිළිගන්නවා ද? පිළිගන්නවා. ඒ හැම රූපයක ම පිත්, සෙම්, සැරව, ලේ, දහඩිය කියලා ආපෝ කොටස් දෙළහක් තියනවා නේ? ඒ හැම තැනක ම දවන, තවන, දිරවන ස්වභාවයෙන් යුක්ත තේජෝ කොටස් හතරක් තියනවා. වායෝ කොටස් හයක් තියනවා. හැම ශරීරයක ම භෞතික ස්වභාවය පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන එක පිළිගන්න පුළුවන් නේ ද? හරි. අර මැටි ටික වගෙ යි.

මැටි ටික සමාන යි කෙස්, ලොම්, නිය, දත් කියන මේ කොටස් ටිකට. කෙස්, ලොම්, නිය, දත් කියන කොටස් ටික සමාන යි මැටි. මැටි ටික පුද්ගලයෙක් සත්ත්වයෙක් නොවෙයි යම් සේ ද කෙස්, ලොම්, නිය, දත් කොටස් ටික පුද්ගලයෙක්, සත්ත්වයෙක් නොවෙයි ම යි. ලිඳේ, වැවේ, පොකුණේ තියන වතුර පුද්ගලයෙක් ද, සත්ත්වයෙක් ද? නෑ. ඒ ආපෝ ස්වභාවය සමාන යි මේ හැම ශරීරයක ම තියන පිත්, සෙම්, සැරව වලට. ගිනි ගොඩකින්, පහනකින්, දර ටිකක් ඇවිලෙන කොට, හිරු රශ්මියෙන් එක උෂ්ණයක් තියෙයි නම් සමාන යි මේ ශරීරයක, රූප මිටියක තියන උෂ්ණය. බාහිර ගස් වැල් පෙරලමින් හමන සුළඟක් සමාන යි මේ ශරීරය එහාට මෙහාට සොලවන වාතය. මේ හැම රූප මිටියක් ම අවකාශ ධාතුවේ රාශිවෙලා තියෙන්නේ පඨවි, ආපෝ, තේජෝ,

වායෝ කියන සතරමහාධාතුවෙන්. අපට තේරෙන්න ඕනෙ නම් ගනිමු පස්, දිය, ගිනි, සුළං කියලා.

**අර මැටි ටිකෙන් වගේ එබඳු වූ සතරමහාධාතු රූප මිටියක් ඇස් ඉදිරිපිටට එන කොට හොඳට බලන්න කෙනෙක්ගේ නෙවෙයි, පුද්ගලයෙක්ගේ නෙවෙයි අර මැටි පිඩ වගේ සතරමහාධාතු රූප මිටියක් එනකොට පින්වතුන් හිතෙන් ඒ රූපය විඳිනවා. ඒ රූපයේ හැඩය හඳුනනවා. හඳුනපු හැඩයට පුංචි අම්මා කියලා හිතනවා. ඒ රූපය යි, මේ හිතපු එක යි දෙකම එකතු කරලා අර රූපය පුංචි අම්මාගේ කියලා දැනගන්නවා. දැන් දැනගත්ත එක හරි ද? දැනගැනීමක් ඇති වුණේ මෙහෙම යි කියලා පින්වතුන් දන්නේ නැති වුණහම, පින්වතුන් විඤ්ඤාණයේ මායාවට හසුවෙනවා. මේ දැනගත්ත එක පින්වතුන්ට ඇත්ත වෙලා අර සතරමහාධාතු රූප මිටිය දැන් පුංචි අම්මා වෙලා. ඔන්න පෙනෙන අරමුණ තණ්හා, උපාදාන වශයෙන් අරගෙන. දැන් පුද්ගලයෙක් වශයෙන් අරගෙන මේ රූපය. අත්තවාද උපාදානය. පුංචි අම්මා, කෙනෙක් කියලා අරගෙන. දැන් ඔන්න අහකට ගියත් පුංචි අම්මාව සිහි කරන්න පුළුවන්කම මනසේ තියෙ යි. සිහි කරන පුද්ගලයා ඉන්නවා. පුද්ගලයා ඉන්න කොට දුකත් තියනවා. දුක තියෙන්නේ පුද්ගලයාට යි. පුද්ගලයා ඉන්නේ අරමුණ සිහි කරන්න පුළුවන් කමට යි. සිහි කරන්න පුළුවන් වුණේ පුංචි අම්මා හැටියට උපාදාන වෙච්ච කමට යි. පුංචි අම්මා හැටියට උපාදාන වුණේ ඇයි? පෙනෙන අරමුණ දැනගත්ත හැටි ගැන දන්නේ නැති නිසා යි.**

හොඳට සිහි ඇතුව, ඇස් ඇතුව බලන්න මේ දිහා. සතරමහාධාතුවෙන් අවකාශ ධාතුව අවුරාගෙන රාශිවෙච්ච රූප මිටිය ඇස් ඉදිරිපිටට ආවේ. අපි ඔප්පු කරලා පෙන්නුවා. ඒ රූපය වින්දේ තමන්. මේ කෙස්, ලොම්, නිය, දත් මේ රූප මිටියම සතරමහාධාතු කන බොන බත්, පාන්, කව්පි, මුං ඇට වලින් හැදෙන්නේ. රූපස්කන්ධයේ උදය වැය බලන්න කියන්නේ, හොඳට පෙනෙනවා රූප මිටියේ ඇත්ත. කන බොන ආහාරය නිසා යි. ස්පර්ශය නිසා වේදනා, සංඥා, චේතනා. මේ ස්කන්ධයන්ගේ උදය වැය බැලුවොත්. එබඳු වූ රූපයක් ඇසට ගැටෙන කොට හිත ඊට

අනුගතව උපදින කොට මේ අරමුණ මට වින්ද හැකි යි. අරමුණ හැඳුනුව හැකි යි. බණ්ඩාරනායක මහත්තයා කියලා හිතුව හැකි යි. ඊට පස්සේ *නාමරූප පච්චයා විඤ්ඤාණං*, මේ හිතපු නාමධර්ම ටික යි, සතරමහාධාතුවෙන් හැඳුණු රූපය යි කියන දෙකම එකතු කරලා මේ රූපය බණ්ඩාරනායක මහත්තයා කියලා දැනගන්නවා. **මේ රූපය දකින කොට බණ්ඩාරනායක මහත්තයා කියලා දැනගන්නවා නම් ඒ දැනගැනීම හැදුනේ මෙන්න මෙහෙම නේ ද කියලා නො දන්නාකම අවිද්‍යාව යි. එතකොට ම වෙන්නේ මොකක් ද? විඤ්ඤාණයේ මායාකාරයා ඉදිරිපත් වෙනවා. මේ රූපය බණ්ඩාරනායක මහත්තයා කියලා යි ගන්නේ. ඔන්න දැන් සතරමහාධාතුව අත්තවාද උපාදානයෙන් අරගෙන. *රූපං අත්තතො සමනුපස්සති*, මේ සතරමහාධාතු රූපය කෙනෙක් හැටියට මම අරගෙන ද නැත් ද? උපාදාන පච්චයා භව. පැත්තකට ගියත් දැන් බණ්ඩාරනායක මහත්තයා සිහි කළ හැකි යි. සිහි කරන කොට, කරන්නා මෙහෙ නිර්මාණය වෙනවා. සිහි කරන අරමුණත් එක්කම යි කරන්නා නිර්මාණය වෙන්නේ. තමන්ව නිර්මාණය වෙලා. තමන් උපන්නා කියන්නේ ම පෙර පසු නැතුව දුක උපන්නා. දැන් බැණුම් අහන්න පුළුවන්, නින්දා විඳින්න පුළුවන්, ලැජ්ජා විඳින්න පුළුවන්, ලැජ්ජාවට කරුණු වෙන, කරුණු කරන පුද්ගලයා නිර්මාණය වෙලා.** දැන් පුද්ගලයා ඇත්ත ම වෙලා.

එයා මේ පෙනෙන අරමුණේ රැවටෙන ටික විතරයි වුණේ, ජරා මරණ දුකට ම හිමිකාරයෙක් වෙලා. ශ්‍රැත්වත් ආර්ය ශ්‍රාවකයා දන්නවා අවිද්‍යාවෙන් පටන්ගත්ත මේ අරමුණ අවසන් වෙන්නේ ජරා මරණ දුකින් කියලා. මාව නිර්මාණය කරලා. පුද්ගලයා හදලා කියලා දන්නවා. එයා දුකට අප්‍රිය යි, දුකට බය යි. ඉපදීමට බය යි, උපන්නොත් දුක් විඳින්න වෙනවා. එයා කැමති ජාති නිරෝධයට යි. ඉපදීම නැති වෙනවාට යි. ඒ නිසා එයා පංචඋපාදානස්කන්ධයේ උදය වැය බලනවා. **පංචඋපාදානස්කන්ධයේ උදය වැය බැලුවොත් විඤ්ඤාණයේ මායා කාරයාට මායා දක්වන්න බෑ. රඟපාන්න බෑ. සතරමහාධාතුව උපාදාන වශයෙන් ගන්න බෑ.**

සතිපට්ඨානයේ කායානුපස්සනාව වඩන කොට පෙන්නනවා නේ *න ච කිඤ්චි ලොකෙ උපාදියති*, ලෝකයේ කිසිදු රූපයක් උපාදන වශයෙන් ගන්නේ නැති විදිහට කායගතාසතිය වඩන්න. දැන් අද අපි මේ රූප ටික සත්ත්වයින්, පුද්ගලයින් කියලා දකිනවා ද නැත් ද? එතකොට මේ සතරමහාධාතුව සත්ත්ව, පුද්ගලභාවයෙන් උපාදන කරගෙන ද ඉන්නේ, නැතුව ද ඉන්නේ? උපාදන කරගෙන යි. **ඔය උපාදන කරගත්තහම තියන දෝෂය මොකක් ද? භවය යි. මොකක් ද භවය කිව්වේ, පුද්ගලභාවයෙන් ඇසුරු කළහම, ඒ අරමුණ ඇස් ඉදිරිපිටින් ගියත් ඒක ඇති බවට සිහි කළ හැකි යි. නිරුද්ධම වෙලා ගියත්, අපි කියමු රූප මිටිය දියවෙලා ගියත් සිහි කළ හැකි යි. ඒ කියන්නේ මැරුණු අම්මා, තාත්තා කියලා සිහි කරන්න බැරි ද? පුළුවන්. භවය. එතකොට සිහි කරන්නා, පුද්ගලයා නිර්මාණය වෙන්නේ ඉබේ ම යි.**

ඒ වගේ දැන් ඔන්න සතරමහාධාතු රූප මිටියක එක හැඩයක් ඔන්න පුංචි අම්මා, ඔය වගේ ම කන බොන ආහාරයෙන් හැදුනු කුණප කොටස් තිස්දෙකකින් යුක්ත සතරමහාධාතු රූප මිටියක් ඇස් ඉදිරිපිටට එන කොට, ඒ අරමුණ විඳලා, අරමුණ හඳුනලා, මගේ දරුවා කියලා හිතනවා. මේ විඳලා, හඳුනලා, කල්පනා කරපු නාම ධර්ම ටිකත්, ඇස් ඉදිරිපිටට ආපු රූපයත් කියන දෙන්නාගේ උපකාරයෙන් මේ හැඩය දරුවා යි කියලා දැනගන්නවා. **මේ හැඩය දරුවා යි කියලා ව්‍යවහාරයට යන්නේ මෙන්න මෙහෙම සිද්ධියකින් නේ ද කියලා එයා දන්නවා නම් එපමණකින් ප්‍රපංච නෑ. මොකද එයා දන්නවා මේ රූපය සතරමහාධාතු යි. මෙහෙම යි මේක වුණේ කියලා.** නමුත් වූ දේ වූ විදිහට දන්නේ නැතිවෙන කොට ම, (අවිද්‍යාව ස්පර්ශ වෙන කොට ම) මොකද වෙන්නේ, අර රූපය දරුවා හැටියට උපාදන කරනවා. ඔන්න දැන් ඒ රූප මිටිය දරුවා. අර රූප මිටිය පුංචි අම්මා.

ඔය වගේ ම රූප මිටියක් ඇස් ඉදිරිපිටට ආවහම ඒක විඳලා, හඳුනලා, කල්පනා කරනවා අයියා. ඒ නාමය යි, අර රූපය යි දෙක නිසා දැනගන්නවා අයියා. එතකොට දැන් දැනගන්නේ ඒ රූප මිටිය අයියා කියලා යි. මෙහෙම බැලුවහම පින්වතුන්ට අයියාගේ රූපය,

පුංචිගේ රූපය, දුවගේ රූපය, පුතාගේ රූපය, අම්මාගේ රූපය, නැන්දගේ රූපය, තමන්ගේ රූපය, මේ රූප ටිකයත් ඇස් ඉදිරිපිටට එන කොට මේ අරමුණ විඳලා, හඳුනලා, මම කියලා හිතලා දැනගන්නවා. දැන් මේ මම කියලා, *නාමරූප පච්චයා විඤ්ඤාණං* කියලා දන්නේ නෑ. එතකොට අර රූපය පින්වතුන් පුංචි අම්මා කළා වගේ, මේ රූපය මම වෙනවා. හොඳට බලන්න මේ රූපයත් කන බොන ආහාරයෙන් හැදුනු සතරමහාධාතු රූපය යි. තමන් කියන මේ රූප ටිකිය ම තමන්ගේ ඇස් ඉදිරිපිටට එනකොට හිතෙන් ම යි මේ අරමුණ විඳින්නේ. හිතෙන් ම යි මේ අරමුණ හඳුනන්නේ. හිතෙන් ම හිතනවා මම කියලා. විඳලා, හඳුනලා, මම කියලා හිතපු නාම ධර්ම ටිකත්, මේ රූපයත් දෙකම නිසා දැන ගන්නවා. මේ රූපය මම කියලා දැනගැනීම ඇති වුණේ මෙහෙම නේ ද කියලා දන්නේ නැතිවෙන කොට පින්වතුන්ට හිතෙන්නේ රූපය මම වගේ කියලා යි. දැන් මේ රූපය මම හැටියට උපාදන වෙනවා. අනිත් රූප අම්මා, තාත්තා, අයියා, අක්කා, හැටියට උපාදන වෙනවා. දැන් පින්වතුන්ට භවය නිර්මාණය වෙලා. තමන් ඉන්නවා, තමන්ට නෑදෑයින්, මිනිසුන්, සත්ත්වයින් ඉන්නවා. ඔන්න භවය උපදවා ගත්තා. භවය හදගත්තා කියන්නේ ජාතිය - තමන් ඉන්නවා. අනිත් සත්ත්වයින් පුද්ගලයින් ඉපදිලා. දැන් ඉතින් ගහගත්ත හැකි යි, බැනගත්ත හැකි යි, කේලාම් කියාගත්ත හැකි යි, රන්ඩු වුණ හැකි යි, හොරකම් කළ හැකි යි, ඕන දෙයක් කළ හැකි යි දැන්. දැන් ඉපදිලා දුක.

ඉතින් බුදුරජාණන්වහන්සේ මෙන්න මේ ටික හෙළි කරලා දෙන්න යි ලෝකයේ පහළ වුණේ. වෙන මීට එහා නිවනක් හොයන්න එපා. ඉපදීම නැති වුණොත් සියලු දුක් නැති වෙනවා. මේ පංචඋපාදනස්කනධයේ උදය වැය නො දකින කොට, ඉබේ ම යි තණ්හා, උපාදන වෙලා, මේ දේවල්, තමන්, ඇති බවට භවය හැදිලා තමනු යි, අනිත් පුද්ගලයනු යි ඉන්නවා කියලා සත්ත්ව පුද්ගල හැඟීම පුද්ගලභාවය හැදෙන්නේ. මෙන්න මේ පුද්ගලභාවයේ ඉපදීමට යි බුදුරජාණන්වහන්සේ *තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති* කියලා කිව්වේ. දැන්

පින්වතුන් මනුස්සයෙක් වෙලා. මනුස්ස යි යන ගණයට යනවා. ඔය විදිහටම විඤ්ඤාණය හීන ධාතුවක පිහිටලා කෙලෙස් ටික ඒ මත පතිත වුණොත් තිරිසන්ගත සත්ත්වයෙක් වෙලා උපදි යි. නිරයේ සත්ත්වයෙක් වෙලා උපදි යි. ඉපදෙන්නේ ඉස්සල්ලා ස්කන්ධ ටික. ස්කන්ධ ටිකේ ඇත්ත දැක්කොත් ඉපදීමෙන් මිදෙන්න පුළුවන්. ස්කන්ධ ටිකේ ඇත්ත දකින්න බැරි වෙන කොට ස්කන්ධ ටිකේ ම උපදින්න වෙනවා. ඒක යි තියන ප්‍රශ්නය.

බුදුරජාණන්වහන්සේ ඉපදීම දුකක් කියලා පෙන්නුවා. ඉපදුන කෙනාට මොන තරම් දුකක් විඳින්න වෙයි ද කියන එක තමන්ව ම අත්විඳින්න. තමන්ගේ ඉපදීම නිසා. ලෝකය ඇත්ත වෙච්ච බව ම දුකක්, පින්වතුනි. උදේ ඉඳන් රෑ වෙනකම් වැඩකරන්න වෙන බව ම දුකක්. ගෙවල් දොරවල් හදන්න වෙන බව ම දුකක්. කවන්න, පොවන්න, පෝෂණය කරන්න වෙන බව ම දුකක්. අපට තේරෙන්නේ නෑ මනස රළු නිසා. බලන්න ඕනේ විදියට ඉන්න පුළුවන් ද කියලා. මේ ලෝකය ඇත්ත වෙච්ච බව ම දුකක් නෙවෙයි ද කියලා බලන්න. එතකොට සංවර වෙන්න ඕනේ, හික්මෙන්න ඕනේ, නොයෙක් ආකාරයට බොහෝ දේ.

එයා දුක දන්නවා. ඉපදීම දුක යි කියලා. *ජාතිඤ්ච පජානාති, ජාති සමුදයඤ්ච* කියන කොට තණ්හා, උපාදන, භව කියන මෙන්න මේ හේතු ටික යි ඉපදීමට හේතුව කියලා දන්නවා. *ජාති නිරෝධඤ්ච පජානාති,* තණ්හා උපාදන නැති වුණොත් භවය නෑ, එහෙම වුණොත් ඉපදීම නෑ කියලා දකිනවා. ඕවට දෙන අර්ථ යි වටින්නේ. ධර්මයට ජීවිතයෙන් පෙන්නන තැනුයි වටින්නේ. හොඳට මතක තබාගන්න වචන ටික විතරක් නෙවෙයි. ඒකයි පින්වතුන් ඒ හාමුදුරුවෝ කියන බණම නේ අනිත් හාමුදුරුවොත් කියන්නේ කියලා දකින්නේ පින්වතුන්ට තව තැනකත් තණ්හා, උපාදන, භව, ජාති කියන වචන ටික ඇහුනොත්, අර හාමුදුරුවොත් කියන්නේ ඒ ටිකම නේ කියනවා. නමුත් පෙළේ නෙමෙයි වටිනාකම තියෙන්නේ, පින්වතුන්ගේ ජීවිතයෙන් අර්ථය පෙන්නන තැන යි වටින්නේ. පින්වතුන් සසර ගෙවාගන්නේ පෙළ දහම නිසා නෙවෙයි, අර්ථය නිසා යි. *අත්ථ මඤ්ඤාය ධම්ම*

*මඤ්ඤදය ධම්මානුධම්ම පටිපන්නො හොති* අර්ථය දැනගෙන, ධර්මය දැනගෙන, ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ හැසිරෙනවා. එදට යි පින්වතුන්ට අජරාමර බවට යන ප්‍රතිපදාවක් හම්බවෙන්නේ. මේ වචන ටික දිහා නෙවෙයි බලන්න ඕනේ. වචනයෙන් තමන්ගේ ජීවිතේ පෙන්නන තැන යි බලන්න ඕනේ. ඉපදීම කියලා කියන කොට පෙන්නපු තැන, භවය කියලා කියන කොට පෙන්නපු තැන, තණ්හා උපාදාන කියන කොට පෙන්නපු තැන, එතකොට ඒකට හේතුව අවිද්‍යාව කියලා පෙන්නපු තැන. මේ වචන ටිකෙන් පෙන්නන අර්ථය දකින්න.

එතකොට මෙයා ඉපදීම දුක යි, දුකට හේතු ටික තණ්හා, උපාදාන, භව යි. ඉපදීම නැති කළොත් අජරාමර යි. ජරා මරණ දුක නැති කරන්න පුළුවන්, ඒක නැතිවෙන්න නම් භවය, තණ්හා, උපාදාන නැතිවෙන්න ඕනේ. ඒ ටික වෙන්න නම් ජාති නිරෝධ ගාමිනී ප්‍රතිපදා. එහෙනම් සම්මා දිට්ඨි. ඇත්ත දකින්න. එදා ඉඳලා මෙයා දුකත්, දුක ඇතිවීමත්, නැතිවීමත්, දුක නැති තැනත් දන්න නිසා දුකින් පීඩිත වෙලා, දුකින් ලැජ්ජිත වෙලා, දුකින් පෙළිලා, දුකින් මැඩිලා, ඉපදීම කියන එක දුකක් බව තේරුනු නිසා, ඉපදීම පිළිකුල් කරන නිසා, එයා වෙලාවක් නෑ කියන්නේ නෑ. එයා වෙලාවක් ගන්නවා ස්කන්ධයන්ගේ උදය වැය බලන්න. වෙලාවක් හදාගන්නවා ස්කන්ධයන්ගේ උදය වැය බලන්න. එයා දන්නවා මේ ජාති නිරෝධයට වෙලාවක් නෑ කියන්නේ, සතර අපායේ ඉපදිලා නම් වෙලාවක් නෑ. ප්‍රේත ලෝකයේ ඉපදිලා නම් වෙලාවක් නෑ. අවීචියේ ඉපදිලා නම් වෙලාවක් නෑ. අසංඥ තලයේ ඉපදිලා නම් වෙලාවක් නෑ. මන්දබුද්ධික වෙලා ඉපදිලා නම් වෙලාවක් නෑ. නුවණක් ඇතුව උපන්නත් ජාති නිරෝධයට ධර්ම දේශනා කරන ශාස්තෘන් වහන්සේ ලෝකයේ පහළ වෙලා නැත්නම් වෙලාවක් නෑ. එයා වෙලාවක් නැතිකම හැටියට දකින්නේ එච්චර යි.

අනිත් හැම කෙනෙකුට ම වෙලාවක් නැතිකම නෙවෙයි, දුක දැනෙන්නේ නැතිකම යි තියෙන්නේ. *දුක්ඛෙ අඤ්ඤාණං* කම තියෙන්නේ එයාට. *දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං* කම නිසා. *දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං* කම නිසා, *දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාය*

*අඥාණං* කමයි තියෙන්නේ කියලා දකිනවා. එයාට දුක තේරුනොත්, දුක ඇතිවෙච්ච හැටිත් තේරුනොත්, දුක නැති බවත් තේරුනොත්, දුක නැති කරන මඟ යොදගන්න එයා පසුබට වෙන්නේ නෑ. කැමති නෑ කවුරුත් හිතලා දුක් විඳින්න. ඒ නිසා **මෙන්න මේ ටික දනගත්ත කෙනා, ස්කන්ධයන්ගේ උදය වැය බලනවා. හොඳට තේරුම් ගන්න ඕනේ ස්කන්ධයන්ගේ උදය වැය කියන්නේ මාර්ගය යි. මාර්ගය වඩන්නේ නිකම් නෙවෙයි දුකත් දකලා, දුක ඇතිවෙච්ච හැටිත් දකලා, දුක නැති තැනත් දකලා, මේක කලහම මේ ප්‍රශ්නය විසඳෙනවා කියලා පෙනෙනවා.** කරන කොට ඇත්තට ම එයාට ප්‍රශ්නයත් විසඳෙයි. බලන්න විසඳෙයි ද නැත් ද කියලා. අම්මා මැරුණා, අයියෝ... තාත්තා මැරුණො, පුතා මැරුණා කියලා සතරමහාධාතු රූපය බදගෙන අඬයි ද කියලා බලන්න, මේ දර්ශනයෙන් ඇස පිරිසිදු වුණහම අඬන්නේ නෑ.

නමුත් සතරමහාධාතු රූප මිටිය අම්මා, තාත්තා, දුව, පුතා කියලා උපාදනව ඉන්න තාක්, ජලය හෝ කිපුණොත්, ගින්න හෝ කිපුණොත්, සුළඟ හෝ කිපුණොත්, පඨවිය හෝ කිපුණොත් ආහාර ප්‍රත්‍යයෙන් හැදුනු සතරමහාධාතු රූපය කුඩුකරගෙන, පොඩිකරගෙන යයි. උපාදන සහිත ලෝකයාට පෙනෙයි අනේ අපේ අම්මා යටවෙලා පස් කන්දට, තාත්තා යටවෙලා මැරුණා. දරුවා මැරුණා. මස්සිණා මැරුණා, මාමා මැරුණා, පුංචි අම්මා මැරුණා කියලා කෑ ගහයි, අඬයි, විලාප දෙයි. ඒ දුක තමන්ගේ ඇස පිරිසිඳ නො දැකීම නිසා යි.

මහණෙනි, මේ ලෝකේ යම් දුකක් එනවා නම්, බයක් එනවා නම්, උපද්‍රවයක් එනවා නම් බාලයා කරාම හැම දුකක් ම, හැම බයක් ම, හැම උපද්‍රවයක් ම එනවා. පණ්ඩිතයාට එන දුකකුත් නෑ, බයකුත් නෑ, උපද්‍රවයකුත් නෑ. ඒ නිසා මහණෙනි, විමසා බලා කටයුතු කරලා පණ්ඩිතයෙක් වෙන්න. කොහොම විමසා බලා ද? ස්කන්ධ වශයෙන්, ධාතු වශයෙන්, ආයතන වශයෙන්, පටිච්ච සමුප්පාද වශයෙන් විමසා බලා කටයුතු කරලා පණ්ඩිතයෙක් වෙන්න කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙනවා.

ඒ නිසා හැම දෙනාට ම මතක් කරනවා, මේ කියාපු දේ තේරුම් ගන්න උත්සාහවත් වෙන්න. ඒකාන්තයෙන් මේ දුක් සහගත සසරින් මිදෙන්න පුළුවන්. මේ අවස්ථාව අතහැරගන්න එපා. මේක සහේතුක යි. සන්දිට්ඨික යි. ඒ කියන්නේ මෙලොව දී ම දකින්න පුළුවන්, සාන්දෘෂ්ඨිකයි මේකේ විපාක. ඒහිපස්සිකයි, මෙහෙ එන්න මෙහෙ ඇවිල්ලා බලන්න කියලා ඕනෑ කෙනෙකුට පෙන්නන්න පුළුවන්. කල් නො යවා ම විපාක දෙනවා. මේ දුක්ඛ නිරෝධ ගාමිනි ප්‍රතිපදාව පුරන්න පුරන්න දුක ගෙවිලා යනවා කියන එකට වැඩි කල් යන්නේ නෑ. එයාගේ ජීවිතයේ දුක වැඩි කල් තියෙන්නේ නෑ, උත්සාහවත් වෙන කෙනාගේ. කල් නො යවා ම මේ ලෝකොත්තර විපාක මට්ටම ලැබෙනවා. ලෝකයාට අයිති කෙනෙක් නෙවෙයි. එයා මේ ස්කන්ධයන්ගේ උදය වැය බලලා අවසන් වෙන කොට - මාර්ගය වඩලා අවසන් කියන්නේ තණ්හා, උපාදාන, භව කියන කෙලෙස් ටික ගෙවලා ඉවර යි. සමුදය දුරු වෙනවා කියන්නේ, කෙලෙස් ටික නැති වෙනවා කියන්නේ, ඉපදීම නැතිවෙලා. ජරා මරණ දුක, නිරෝධය ක්ෂාත් ක්ෂාත් කරලා ඉවර යි. මාර්ගය වඩලා ඉවර වෙන කොට සමුදය දුරු කරලා, නිරෝධය ක්ෂාත් ක්ෂාත් වෙලා ඉවර යි. දුක පිරිසිඳ දැකලා ඉවර යි.

දැන් එයා මනුස්සයෙක් යන ගණයට යන්නේ නෑ. ඉපදීම නැති වුණා. එයා දෙවියෙක් යන ගණයට යන්නෙත් නෑ. බ්‍රහ්මයෙක් යන ගණයට යන්නෙත් නෑ. යක්ෂයෙක් යන ගණයට යන්නෙත් නෑ. මේ ලෝකයේ කිසිවෙක් යන ගණයට යන්නේ නෑ. *විප්පමුත්තස්ස සබ්බධී* - සියලු ම තැනින් මිදුණු කෙනෙක්. එයාට කියනවා ක්ෂීණාශ්‍රව රහතන්වහන්සේ කියලා. නැතිවෙන්න දෙයක් නෑ. නැතිවෙන්න ඇතිවෙලා නෑ මොකුත්. ඒ නිසා සුවසේ ඉන්නවා. දුකක් නැතුව ඉන්නවා. අන්න ඒ තැනට පත්වෙච්ච පුද්ගලභාවයේ ඉපදීම නැති කළා. ඕකට කියනවා අනුපාද පරිනිර්වාණය කියලා. ඇස උපාදාන වශයෙන් නො ගෙන, රූපය උපාදාන වශයෙන් නො ගෙන, මේ ස්පර්ශ ආයතන හය උපාදාන වශයෙන් නො ගෙන මිදුණු තැනට කියනවා, රහතන්වහන්සේ කියලා. ක්ලේශ පරිනිර්වාණය කියලා. සෝපදිසේස නිබ්බාන කියලා. ඉපදීම නැති

කළා. එයා ප්‍රකාශ කරනවා, *ඛීණා ජාති* - ඉපදීම නැති වුණා. හොඳට තේරෙනවා දැන් ඉපදීම නෑ පුද්ගලයාගේ. *වුසිතං බ්‍රහ්ම චරියං*, යමක් සඳහා සිල් සමාදන් වුණා නම්, සමාධි වැඩුවා නම්, විදර්ශනා කළා නම්, දැන් නැවත මම සිල් රකින්න අවශ්‍ය නෑ. සමාධි වඩන්න අවශ්‍ය නෑ. විදර්ශනා කරන්න අවශ්‍ය නෑ. මේ බ්‍රහ්මචරියාවේ හැසිරිලා ඉවර යි. *වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණියං*, කළ යුත්ත කළා. *නාපරං ඉත්ථත්තාය*, මත්තේ කළ යුත්තක් නෑ.

*ඛීණා ජාති*, ජාතිය ඉවරයි කියලා කියන්නේ ජීවත්ව ඉද්දි ම නේ? ඉපදීම නැති වුණා කියන නුවණ එන්නේ ජීවත්ව ඉද්දි ම යි. එතකොට මරණින් පස්සේ නො හටගත්ත දෙයක් බලාගෙන ද කිව්වේ? නැති කළ දෙයක් අරබයා නෙවෙයි ද කිව්වේ? ඒ කියන්නේ ඉපදීම නැති වෙච්ච බව ප්‍රත්‍යක්ෂ වෙච්ච නිසා ම කිව්වා මිසක, මත්තේ ඉපදෙන්නේ නෑ කියන එකක් බලාගෙන කිව්වා නෙවෙයි. මතු කතාවක් නෑ. පූර්ව, අපර අන්තයකට දුවන්නේ නෑ රහතන්වහන්සේ. මත්තේ ඉපදෙන්නේ නෑ කියන එකෙන් කියනවා නම් 'අතීතයේ උපන්නා' කියන්න වෙයි. 'අතීතයේ උපන්නා', 'අනාගතේ උපදියි' කියලා එකක් නෑ, එහෙම.

ඉතින් මෙන්න මේ වගේ දර්ශනයක් බුදු දහම කියන්නේ. ඇස් පනාපිට බලලා, දැකලා ආශ්‍රවයන්ගෙන් කෙලෙසුන්ගෙන් මිදිලා, සියලු දුකින් මිදිලා, නිවිලා, සිසිල් වෙච්ච ජීවිතයක් හදාගන්න පුළුවන් තැනක්. එබඳු වූ ශාස්තෘන් වහන්සේ නමක් හම්බවෙච්ච මේ වෙලාවේ, ඒ ශාස්තෘන් වහන්සේ දේශනා කරන අජරාමර ධර්මය අහගන්න පුළුවන් වෙච්ච වෙලාවේ, අහලා තේරුම් ගන්න පුළුවන් මනුස්සයෙක් වෙච්ච වෙලාවේ, මේකට කියනවා ක්ෂණ සම්පත්තිය. ක්ෂණ සම්පත්තිය ලැබුණු මේ අවස්ථාව අතහැර ගන්න එපා, කියන එක මතක් කරනවා.

හැමදාමත් කියනවා වගේ බොහෝ දෙනෙක් සසර මෙතෙර ම ඉපදිලා මෙතෙර ම මැරෙන අය. පරතෙරක් හොයන්නේ බොහොම ටික දෙනා යි. ඒ නිසා සසර පරතෙරක් හොයන්න

උත්සාහවත් වෙන්න. වැඩි ඈතක යන්න ඕනේ නෑ, මේ වචන ගැන විශ්වාස කරන්න ඕනේ නෑ. මේකට හිත තියලා බලන්න තමන්ට ප්‍රත්‍යක්ෂයක් එයි, මේ දහම් පරියාය. හැබැයි පින්වතුන් නුවණින් මේකට හිත තියලා නො බලන තාක්, ප්‍රශ්නය ලෙහෙන්නේ නෑ. තේරෙන්නේ නෑ. මෙතනින් සෑහීමකට පත්වෙන්න බෑ. ආයෙත් හොයන්න යනවා. තව තැනක් හොයන්න වෙයි. කෙටි ක්‍රම නෑ පින්වතුනි. මේ ගහපු ගැටේ තමන් ම ලෙහාගන්න වෙනවා. වෙන ක්‍රමයක් තියනවා නම් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. ක්‍රමය ඕක ම යි. සමහර විට දේශකයානන් වහන්සේලාගේ දක්ෂ අදක්ෂ තාවය මත ඕකේ අර්ථය තව ලිහිල් කරලා දෙන්න පුළුවන් වෙයි. ඒකට සරළ උපමා උපමෙයා දෙන්න පුළුවන් වෙයි. මගේ මනස ඉතින් දුබල යි. ඒකට පුළුවන් මට්ටම තමයි මේ කියලා දුන්නේ. හැබැයි මතක් කරනවා එක දෙයක්, වෙන විමුක්තියක් හොයන්න එපා. වෙන තැනක් නෑ, අජරාමර බවට. වෙන නිවනක් හොයන්න එපා. නිවන කියන එක, දූන, දූක යා යුත්තක්. ජාති නිරෝධය යි, නිවන කියන්නේ කියන එක දන්නවා. එයා ජාතියත් හඳුනගෙන තියනවා. මේ ජාති නිරෝධයට යි මේ සාසනයේ මඟ පෙන්නන්නෙ කියලාත් දන්නවා. දූනගෙන සිල් රකින්නේ, සමාධි වඩන්නේ, විදර්ශනා කරන්නේ. දූන දූක. දන්නා වූ, දක්නා වූ නිවන ක්ෂාත් ක්ෂාත් කරගන්න මිසක, නො දන්නා වූ, නො දූක්කා වූ නිවනක් අරබයා නොවේ.

මේ ධර්මය අකාලික යි. කුසල ධර්මයෝ, ලෞකික දේවල් තමයි කාලික. අපි හිතාගෙන ඉන්නේ ලෞකික දේවල්, අකාලික යි කියලා යි. මේ ධර්මය කාලික යි කියලා යි. කාලික යි, අකාලික යි කියන්නේ මොකක් ද? දනයක් දුන්නොත්, පින් කමක් කළොත් දිව්‍ය ලෝකයේ යන්න ඒකට සුදුසු කාලයක් තියනවා. දන් දීලා ඉවර වෙච්ච ගමන් ම දිව්‍ය ලෝකයේ උපදින්නේ නෑ. ඒ නිසා ඒ වගේ පින්කම් වලට කියනවා කාලික යි කියලා. ඇස් ඉදිරිපිටට එන අරමුණට දූන් හිත තියලා විදර්ශනා කරන්න. පුද්ගලභාවයෙන් එන

දුක ඒ මොහොතේ ම මිදෙනවා. අකාලික යි. මේ ධර්මය සන්දිට්ඨික යි, අකාලික යි.

නමුත් ලෝකයා හඳුනාගෙන තියෙන්නේ පින්කම් අකාලික යි, මේ ධර්මය කාලික යි කියලා යි. ඒකේ අනිත් පැත්ත. ඒ නිසා නො දක්ක නිවනක්, නො පැමිණි නිවනක් බලාගෙන බ්‍රහ්මචරියාවේ හැසිරෙනවා නෙවෙයි. මරණින් පස්සේ ජාති නිරෝධයක් බලාගෙන නම් පින්වතුන් බණ භාවනා කරන්නේ, මරණින් පස්සේ නිවනක් බලාගෙන නම්, මේ සාසනයෙ යි අනිත් සාසනවල යි වෙනසක් නෑ. කවුද දන්නේ සදාකාලික ස්වර්ගයට ගියාමත් උපදින්නේ නැතිවෙයි නේ එහෙනම්. එහෙම නැත්නම් සත්‍යය වූ, සැබෑ වූ එකම දෙවියන් වහන්සේ ගාවට ගියාමත් විමුක්තියක් ලැබෙනවා කියලා කෙනෙක් කියනවා. සදාකාලික ස්වර්ගයට ගිහාම සියලු දුක් නෑ, නැවත උපදින්නේ නෑ, සදාකාලික යි එතන කියනවා. අපිත් කියනවා මරණින් පස්සේ නිවන් දැක්කහම දුකක් නෑ සදාකාලික යි. ඔක්කො ම එක ම ගොඩේ නේ. ඉන්නකන් දුක් විඳලා විඳලා, මරණින් පස්සේ ලැබෙන නිවනත් වැඩක් තියෙයි ද? දුක නිවෙන්න ඕනේ දුක තියන කොට නේ. ඒක නේ පිළිගන්න පුළුවන්. ඒක නේ සහේතුක. ඉන්නකම් නින්ද, අපහාස, ඇණුම් බැණුම් අහලා, පීඩා විඳලා, අම්මා, තාත්තා, දරුවන් මැරිලා දුක් විඳලා විඳලා මරණින් පස්සේ මව් මළ දුක, පියා මළ දුක, දරු මුණුපුරන් නැතිවෙලා එන දුකෙන් මිදෙනවා කියන කොට මේක විහිළුවක් නෙවෙයි ද? ඒ නිසා පින්වතුන් බුද්ධිමත් වෙන්න කියන එකත් මතක් කරනවා. මේ කියන එක තේරුම් ගන්න උත්සාහවත් වෙන්න. කොහොම හරි මේ ජීවිතයට පිහිටක් රැකවරණයක් කරගන්න කියන එකත් පෙන්නනවා. ඒ සඳහා මේ දේශනාව හේතු උපනිශ්‍රයම වේවා! බුදු, පසේ බුදු, මහරහතන්වහන්සේලා නිවී සැනසී පැමිණ වැඩ වදාළා වූ, උතුම් වූ, ජාතියක් නැති, ජරාවක් නැති, ව්‍යාධියක් නැති, මරණයක් නැති, ශෝකයක් නැති අජරාමර නිර්වාණ සම්පත්තිය අද අද ම වහ, වහාම ක්ෂාත් ක්ෂාත් කරගන්නට මේ සැමදෙනාට ම මේ කුසල් ධර්මයෝ උතුම් නිවන් පිණිස ම පාරමිතාවක් වේවා!

“මහණෙනි, මේ ලෝකේ යම් දුකක් එනවා නම්, බයක් එනවා නම්, උපද්‍රවයක් එනවා නම් බාලයා කරාම හැම දුකක් ම, හැම බයක් ම, හැම උපද්‍රවයක් ම එනවා. පණ්ඩිතයාට එන දුකකුත් නෑ, බයකුත් නෑ, උපද්‍රවයකුත් නෑ. ඒ නිසා මහණෙනි, විමසා බලා කටයුතු කරලා පණ්ඩිතයෙක් වෙන්න. කොහොම විමසා බලා ද? **ස්කන්ධ වශයෙන්, ධාතු වශයෙන්, ආයතන වශයෙන්, පටිච්ච සමුප්පාද** වශයෙන් විමසා බලා කටයුතු කරලා පණ්ඩිතයෙක් වෙන්න” කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙනවා.

ඉතින් මෙන්න මේ වගේ දර්ශනයක් බුදු දහම කියන්නේ. ඇස් පනාපිට බලලා, දකලා ආශ්‍රවයන්ගෙන් කෙලෙසුන්ගෙන් මිදිලා, සියලු දුකින් මිදිලා, නිවිලා, සිසිල් වෙච්ච ජීවිතයක් හදගන්න පුළුවන් තැනක්. එබඳු වූ ශාස්තෘන් වහන්සේ නමක් හම්බවෙච්ච මේ වෙලාවේ, ඒ ශාස්තෘන් වහන්සේ දේශනා කරන අජරාමර ධර්මය අහගන්න පුළුවන් වෙච්ච වෙලාවේ, අහලා තේරුම් ගන්න පුළුවන් මනුස්සයෙක් වෙච්ච වෙලාවේ, මේකට කියනවා ක්ෂණ සම්පත්තිය. ක්ෂණ සම්පත්තිය ලැබුණු මේ අවස්ථාව අතහැර ගන්න එපා, කියන එක මතක් කරනවා.